سنهالية
٢٠٤

الإصدار الحادي والعشرون

# මුස්ලිම් අත්පොත

## ප්‍රතිපත්ති-වැදුම්පිදුම්-ගනුදෙනු


කතෘ
අබ්දුල් කරීම් අබ්දුල් මජීද් අල්-දයිවාන්

සංශෝධනය
අබූ හාඉරා මුහම්මද් හුසෙයින්


# دليل المسلم

## عقيدة - عبادات - معاملات


تاليف
عبدالكريم عبدالمجيد الديوان

ترجمة/ قسم توعية الجاليات بالمكتب التعاوني للدعوة والإرشاد بحي الروضة





The Cooperative Office For Call & Guidance to Communities at Rawdhah Area
Under the Supervision of Ministry of Islamic Affairs and Endowment
and Call and Guidance -Riyadh - Rawdhah
Tel. 4922422 - fax 4970561 E.mail: mrawdhah@hotmail.com P.O.Box 87299 Riyadh 11642

# මුස්ලිම් අත්පොත

## ප්‍රතිපත්ති - වැඳුම්පිදුම් - ගනුදෙනු


කතෘ

අබ්දුල් කරීම් අබ්දුල් මජීද් අල්-දයිවාන්

සංශෝධනය

අබූෂාඉරා මුහම්මදු හුසෙයින්

ح المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالروضة، ١٤٢٥هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

العثيمين، محمد بن صالح

دليل المسلم / محمد بن صالح العثيمين - الرياض، ١٤٢٥ هـ.

٥٠ ص ؛ ١٢ X ١٧ سم

ردمك : ٤ - ٠ - ٩٥٣٩ - ٩٩٦٠

(النص باللغة السنهالية)

١- الإسلام - مجموعات أ- العنوان

ديوي ٢١١ ١٤٢٥/٢٤٥٩

رقم الايداع: ١٤٢٥/٢٤٥٩

ردمك: ٤-٠-٩٥٣٩-٩٩٦٠

بسم الله الرحمن الرحيم

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන්

# පෙරවදන

පැසසුම් සියල්ල සර්ව බලධාරි අල්ලාහ්ට හිමිය. තවද, අවසාන වක්තෘ මුහම්මද් තුමාට අල්ලාගේ සදා ශාන්තිය හා සමාදානය උදාවේවා!

මෙම පොත් පිංච නව මුස්ලිම්වරුන් හට ඉස්ලාම් ආගම ගැන කෙටියෙන් හෝ යම් අවබෝධයක් ලබාදීමේ මහගු අදහස උදෙසා නිමවූවකි. මෙහි ප්‍රතිපත්ති, වන්දනාමාන සහ ආගම අනුමත කළ නොඅනුමත කළ වැදගත් සමහර ක්‍රියාවන් ඇතුලත් කර ගත් නමුදු, ඉස්ලාම් ආගම ගැනවූ සියලු විස්තර අඩංගු වී ඇති බව නොසිතන්න. ඉස්ලාම් ගැනවූ මනා දැණුමක් ලබා ගැනීමට මෙම පොත නොසෑහේ. එහෙයින් ඉස්ලාම් ආගම ගැන වැඩි දුරටත් අධ්‍යයනය කිරීම පිණිස අනෙකුත් පොත්පතෙහි සහ ආගමෙහි නිබොරු මනා අවබෝධයක් ඇති උගතුන්ගේ උදවුව පැතීම ඔබගේ අසහාය යුතුකමකි.

මෙම වැයම අල්ලාහ් වෙනුවෙන් වූ ක්‍රියාවක් වීමට මහු ගෙන්ම අයදිමි. එමෙන්ම පිටිවහල සහ මෙම කටයුත්ත සඳහාවූ පරිපූර්ණත්වයද මහුගෙන්ම පතා සිටිමි.

අබ්දුල් කරීම් බින් අබ්දුල් මජීද් අල්-දීවාන්

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන්

## පළමුවන කොටස

# 1. අකීදා

## ඉස්ලාමීය ප්‍රතිපත්ති

මුස්ලිම්වරයෙකු අල්ලාහ්, අල්ලාහ්ගේ දේව දූතයන්, දේව හෙළිකිරීමෙන් යුත් දේවග්‍රන්ථ, අල්ලාහ් විසින් පත් කරන ලද වක්තෘවරු, පරමාන්ත දිනය සහ පූර්ව සැළැස්ම (දෛවය) කෙරෙහි විශ්වාස කිරීම අනිවාර්යයවේ.

### 1. අල්ලාහ් කෙරෙහි විශ්වාසය කිරීම:

අල්ලාහ්ගේ මවා පෝෂණය කිරීමේ තත්ත්වය කෙරෙහි විශ්වාසය කිරීම:

☆ එනම් අල්ලාහ්, විශ්වයේ සියල්ලන්ගේ මැවුම්කරුවා, සියලු බලමහිමයන් ලද පරිපාලකයා සහ සියලු ක්‍රියාවන් තීරණාත්මකව ක්‍රියා කරන්නාද වෙයි.

☆ නිර්මාණය කිරීමට එකම සුදුස්සා අල්ලාහ් පමණක් බව පිළි ගනිමු.

﴿ هَلْ مِنْ خَالِقٍ غَيْرُ اللَّهِ يَرْزُقُكُم مِّنَ السَّمَاءِ وَالأَرْضِ﴾

*'අහසේ සහ මහපොළොවේ සිට ඔබ පොෂණය කිරීමට සුදුසු අල්ලාහ් හැර අන් මැවුම්කරුවෙකු වේද?* (35 : 3)

සියලු මැවීම්හී ආධිපත්‍යය අල්ලාහ්ට පමණි. එහෙයින් නිර්මාතෘවරයාම සියල්ලන්ගේ භාරකාරවරයාද වන්නේය.

﴿وَلِلَّهِ مُلْكُ السَّمَاوَاتِ وَالأَرْضِ﴾

*සැබැවින්ම අහසේ සහ මහපොළොවේ සියලු ආදිපත්තීන් අල්ලාහ් දෙවිඳුට අයත්වේ.* (3 : 189)

☆ සියල්ලක්ම සර්වබල අල්ලාහු තආලා විසින් පමණක් සැලසුම් කර ක්‍රියාත්මක කරණ බව විශ්වාස කිරීම :

එනම් සැලසුම් කර ක්‍රියා කිරීමට අල්ලාහ් පමණක් හැර අන් කිසිවෙකු නැති බව මිනිසා පිළිගත යුතුය.

﴿قُلْ مَن يَرْزُقُكُم مِّنَ السَّمَاءِ وَالأَرْضِ أَمَّن يَمْلِكُ السَّمْعَ والأَبْصَارَ وَمَن يُخْرِجُ الْحَيَّ مِنَ الْمَيِّتِ وَيُخْرِجُ الْمَيَّتَ مِنَ الْحَيِّ وَمَن يُدَبِّرُ الأَمْرَ فَسَيَقُولُونَ اللّهُ فَقُلْ أَفَلاَ تَتَّقُونَ . فَذَلِكُمُ اللّهُ رَبُّكُمُ الْحَقُّ فَمَاذَا بَعْدَ الْحَقِّ إِلاَّ الضَّلاَلُ فَأَنَّى تُصْرَفُونَ﴾

*'නබි තුමනි, 'අහසෙන් සහ මහපොළොවෙන් ඔබ පෝෂණය කරන්නේ කවරෙක්ද? ඔබ සවනය, සහ දෘෂ්ටිය කෙරෙහි බලපවත්වන්නේ කවරෙක්ද? අජීවී දෙයින් ප්‍රාන යන්ද, සජීවී දෙයින් අප්‍රාන දේද නිර්මාණ කරන්නේ කවරෙක්ද? විශ්වයේ සියලු ක්‍රියාවන් සැලසුම් කර ක්‍රියා කරවන්නේ කවරෙක්ද?' යනුවෙන් ඔබ ඔවුන්ගෙන් අසනු මැනව. වහා 'අල්ලාහ්' යනුවෙන් ඔවුන් පවසනු ඇත. 'එසේ නම් ඔබලා ඔහුට බියව පසුවිය යුතු නොවේද?'යි විමසනු මැනවි. ඔබගේ එම සැබෑ සුරක්ෂිතයා අල්ලාහ්වේ. මෙම සත්‍යයට පසුවද (ඔබ ඔහු නොවඳින්නේ නම්) නොමග හැරෙන්නට අනෙකක් නොවේ. මෙම සත්‍යයෙන් ඔබ කොහි හරවනු ලබන්නේද?'* (10 : 31-32)

- වැඳුම්පිදුම් සියල්ල ඉටුවිය යුත්තේ අල්ලාහ්ට පමණක් බව විශ්වාස කිරීම: එනම් වැඳුම්පිදුම් සහ අනෙකුත් වන්දනාමානවලට එකම සුදුස්සා අල්ලාහ් බව පිළිගත යුතුය. වැඳීමට සුදුසු එකම සත්‍ය දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැත. ඔහු හැර ඔහුට සමානව වඳිනා අන් සියලු (මිත්‍යා ප්‍රබන්ධ) දේ ප්‍රතික්ෂේප කළයුතු ඒවා වේ.

﴿ذَلِكَ بِأَنَّ اللَّهَ هُوَ الْحَقُّ وَأَنَّ مَا يَدْعُونَ مِن دُونِهِ الْبَاطِلُ﴾

*'මන්දයත් සත්‍ය දෙවියා අල්ලාහ් පමණි. ඔහු හැර ඔවුන් අමතන සියල්ල ව්‍යාජ ඒවා වේ.'* (31 : 30)

ප්‍රාර්ථනාවන්, උදව් පැතීම, මාංශදානය සහ භාරයන් වීම වැනි වන්දනාමාන ක්‍රියාවන් සියල්ල අල්ලාහ් හැර අන් කෙනෙකු හට කරන්නේ නම්, ඔහු අල්ලාහ්ට ෂිර්ක් (ආදේශ) කළ අයෙකු ලෙස වන්නේය. එහෙයින් කෙනෙකු අල්ලාහ් හෝ සුරදූතයෙකු හෝ වක්තෘවරයෙකු හෝ අන් කෙනෙකු හෝ දෙවියෙකු ලෙස ආදේශ කර ඇමතීමෙන් හෙතෙම අල්ලාහ්ට ආදේශ කළ අයෙකු වන්නේය. මෙවන් ක්‍රියාවන් කරන අය අල්ලාහ් කිසිවිටෙක සමා නොවන අතර ඔහු අවසානයේදී පත්වන ස්ථානයද නිරය වේ. (එවැන්නෙකු තම මරණයට පෙර පශ්චාත්තාප වී පවසමා අයදින්නේ නම් අල්ලාහ් ඔහුගේ පව සමා විය හැකිය.)

﴿ إِنَّ اللَّهَ لاَ يَغْفِرُ أَن يُشْرَكَ بِهِ وَيَغْفِرُ مَا دُونَ ذَلِكَ لِمَن يَشَاءُ ﴾

*සැබැවින්ම අල්ලාහ් තමාට ආදේශ කිරීම කිසිසෙත් සමා නොකරයි. ඒ හැර අන් සියල්ල තමා මනාප අයට සමා දෙයි.* (4 : 116)

අල්ලාහ් තමාට ඇති බවත් මුහම්මද් නබි (සල්) තුමා විසින් අල්ලාහ්ට ඇති බවත් ස්ථිරසාරව පවසන ලද නාමයන් සහ ගුණාංගයන් ඒ අයුරින්ම පිළිගත යුතුය. නමුදු අල්ලාහ්ගේ එවැනි ගුණාංගයන් හෝ නාමයන් හෝ කිසිවිටෙක කිසිදු නිර්මාණයන් විද්‍යාමාන මැවීම් හා සැසඳිය නොහැකිය. තවද අල්ලාහ්ගේ ගුණාංගයන් මෙසේය යනුවෙන් කිසිවෙකු තම සිත්සේ පැහැදිලි හෝ වර්ණනා හෝ නොකළ යුතුය.

﴿ لَيْسَ كَمِثْلِهِ شَيْءٌ وَهُوَ السَّمِيعُ الْبَصِيرُ﴾

*ඔහුට සමව කිසිවක් නැත. නමුදු ඔහු සියල්ල සවන් දෙන්නා, බලන්නා වේ.* (සූරා අෂ්ෂූරා 11)

අල්ලාහ්ට විය යුතු සහ නොතිබිය යුතු ගුණාංගයන් ගැන පොදුවේ සහ විස්තරාත්මක ශුද්ධවූ අල්කුර්ආනය, නබි තුමාගේ සුන්නාහ් සංකල්පයන් සහ ඉස්ලාම් දහමේ නියම ලෙස යහමගවූ පෙර ඍෂිවරුන්ගේ කරුණු පිළිගත යුතුයි. ඔවුන් ඒවා කෙසේ විස්තර කර තිබේදෝ, ඒවා එසේම විනා ඒවාට උපමා කිරීම්, විකෘති කිරීම් නිශ්ප්‍රභා කිරීම සහ වෙනස් කිරීමෙන් වැළකී ප්‍රකාශ කළ අයුරු පිළිගත යුතුය.

එසේම සර්වඥාත අල්ලාහ් දෙවිඳු සහ මුහම්මද් නබි (සල්) තුමා අල්ලාහ්ට නොතිබිය යුතු යැයි පැහැදිළිව වැළැක්වූ ගුණාංගයන් සහ ක්‍රියාවන්ද විදහා පෑමෙන් මුළුමනින්ම වැළකිය යුතුය. නවද අල්ලාහ් දෙවිඳු සහ අල්ලාහ්ගේ වක්තෘ තුමා කුමක් ගැන සඳහන් නොකළේද, අපද ඒවා ගැන සඳහන් නොකළ යුතුය.

⋆ අල්ලාහ් ඉහළ අහසෙහි අර්ෂ්ට ඉහළින් සිංහාසනාරූඪ වෙමින් තම නිර්මාණයන්ගේ තත්වය දැනගනිමින්, කියමන් හට සවන් දෙමින්, සියල්ල පාලනය කරමින් ක්‍රියාවන් නිරීක්ෂණය කරමින් පසු වන්නේය. අල්ලාහ් සියළු දේ කෙරෙහි බලපවත්නේය.

2. දේවදූතයන් කෙරෙහි විශ්වාස කිරීම:

දේව දූතයන්ගේ ලොව අදෘශ්‍යමාන ලොවකින් එකක් වේ. අල්ලාහ්ගේ නිර්මාණයක් වන දේවදූතයන් කෙරෙහිද විශ්වාස කළ යුතුය.

﴿ عِبَادٌ مُّكْرَمُونَ لَا يَسْبِقُونَهُ بِالْقَوْلِ وَهُم بِأَمْرِهِ يَعْمَلُونَ ﴾

*ඔවුන් (අල්ලාහ්ගේ) සම්භාවණීය අතවැසියන් වේ. ඔවුන්, කිසිවක් ඔහුට ඉහළින් කතා කරන්නේ නැත. ඔවුන් ඔහුගේ ආඥාව අනුව ක්‍රියා කරන්නෝය.* (21 : 26–27)

අල්ලාහ් ඔවුන් ආලෝකයෙන් නිර්මාණය කළේය. ඔවුන් සදා අල්ලාහ්ගේ උත්කෘෂ්ඨභාවය ප්‍රශංසා කරමින්, වැඳපුදා ගනිමින් සහ අල්ලාහ්ට කීකරු වෙමින් පසු වෙති. මෙම විශ්වය තුල අල්ලාහ්, විවිධවූ ආඥාවන් සහ කර්තව්‍යයන් ඔවුන්ට පවරා ඇත. ඔවුන්ගෙන් සමහරෙක් මිනිසා ආරක්‍ෂා කිරීම, මිනිසාගේ ක්‍රියාවන් සටහන් කිරීම සහ ඔවුන්ගේ ප්‍රාණයන් අත්පත් කරගැනීම සහ වෙනත් බොහෝ එවැනි ක්‍රියාවන් උදෙසාද පත් කර ඇත.

අල්ලාහ් විසින් ඔවුන් අප දෘෂ්ටියට හසු නොවන අයුරු පත්කළේය. අප ඔවුන් දකින්නේ නැත. නමුදු අල්ලාහ් සමහර පින්වතුන් හට ඔවුන් දර්ශනය කළේය.

අල්ලාහ් විසින් ඔවුන් හට විවිධවූ විශේෂ හැකියාවන් ලබා දී ඇත (කඩිනමින් ක්‍රියා කිරීම, ශක්තිය සහ වෙස්මාරුව වැනි විශේෂ හැකියාවන්). ඔවුන් වෙහෙසට පත්වන්නේ නැත. ඔවුන්ගේ සංඛ්‍යාවද අසීමිතය.

අල්ලාහ් ඔවුනතරින් සමහරුන්ගේ නම් සහ ක්‍රියාවන් ගැනද පැහැදිලි කර දී ඇත.

ජිබ්රීල් : වක්තෘවරුන් හට වහි නම් දිව්‍ය පණිවිඩය රැගෙන පැමිණෙන අග්‍ර සුරදූතයා වේ.

﴿قُلْ مَن كَانَ عَدُوًّا لِّجِبْرِيلَ فَإِنَّهُ نَزَّلَهُ عَلَىٰ قَلْبِكَ بِإِذْنِ اللَّهِ﴾

*ජිබ්රීල්ට සතුරෙකු ලෙස ක්‍රියා කරන්නේ කවරෙක්ද, (ඔහු අල්ලාහ්ට සතුරෙකු වේ) සැබැවින්ම ඔහු අල්ලාහ්ගේ ආඥාවන් අනුව ඔබ සිත්හි (කුර්ආනය) පහළ කරන් නේය' යනුවෙන් පවසන්න.* (සූරා අල් බකරා : 97)

මාලික් : නිරයේ භාරකාරයා ඔහු වේ.

﴿وَنَادَوْا يَا مَالِكُ لِيَقْضِ عَلَيْنَا رَبُّكَ قَالَ إِنَّكُم مَّاكِثُونَ﴾

*තවද (අපා ගතව එහි දුක් විඳින) ඔවුන් 'මාලික් ඔබ දෙවියා අප (මරණයට පත් කිරීම තුලින්) විනිශ්චයක් ලබා දෙන්වා' යනුවෙන් විලාප නගනු ඇත. එයට ඔහු 'ඔබලා (මෙහි) සදහටම පසුවන අය වේ' යනුවෙන් පවසනු ඇත.* (සූරා සුක්රුෆ් : 77)

මුන්කර් සහ නකීර් : කෙනෙකු මැරී භූමදාන කළා යින් පසු ඔවුන්ගේ මිනිවල වෙත පැමිණ සසර ක්‍රියාවන් ගැන විමසන දෙන්නා මොවුන් වේ.

3. දේව ග්‍රන්ථ කෙරෙහි විශ්වාස කිරීම:

අල්ලාහ් විසින් සියලු වක්තෘවරු වෙත පහළ කරන ලද සියලු දේව ග්‍රන්ථයන් කෙරෙහි විශ්වාස කළ යුතුය.

අවසාන වක්තෘ මුහම්මද් තුමා වෙත පහළ අල්කුර්ආනය පහළවූ සියලු ආගමික ග්‍රන්ථ අතරින් ශ්‍රේෂ්ඨයම වේ. එය පහළ වීමෙන් පසු පෙරවූ සියලු ග්‍රන්ථයන් අවලංගු විය යනුවෙන්ද විශ්වාස කළ යුතුය.

﴿مُصَدِّقًا لِّمَا بَيْنَ يَدَيْهِ مِنَ الْكِتَابِ وَمُهَيْمِنًا عَلَيْهِ﴾

*මෙය මෙයට පෙරවූ දේව ග්‍රන්ථයන් සත්‍යථ කරන අතර ඒවා ආරක්ෂා කරයි.* (සූරා අල්-මාඉදා : 48)

අල්කුර්ආනයට පෙර පහළ කරන ලද සියලු දේව ග්‍රන්ථ යන් මිනිස් දැතෙන් විකෘති විය. එහෙයින් පෙර වූ ආගමි ග්‍රන්ථයන් අනුගමණකින් තොරව අල්කුර්ආනය පමණක් අනුගමණය කිරීම අනිවාර්යය වේ. තමා විසින් පහළ කරණ ලද ග්‍රන්ථය වන අල්කුර්ආනය ඒහි පරිශුද්ධ තාවය විකෘති කරන්නන්ගෙන් තමාම එය ආරක්ෂා කරන බව අල්ලාහ් පොරොන්දු වී සිටියි.

﴿إِنَّا نَحْنُ نَزَّلْنَا الذِّكْرَ وَإِنَّا لَهُ لَحَافِظُونَ﴾

*සැබැවින්ම දික්ර් (නම් මේ දිව් වදන්) ඔබ වෙත පහළ කළේද අපය. සැබැවින්ම එහි ආරක්ෂකයන්ද අප වෙමු.* (සූරා අල්හිජ්ර් : 9)

අල්කුර්ආන්හි සඳහන්වී ඇති දෙයින් කිසිවක් යමෙකු ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ එහි ඌනතා, වෙනස් වීම්, විස්තර කිරීම් හා අඩුවැඩියෙන් සිදුවී ඇති බවට වාද කරන්නේ නම් ඔහු කාෆිර් බවට පත් වේ.

පරිශුද්ධවූ අල්කුර්ආනය අල්ලාහ්ගේ ප්‍රකාශයක් වේ (එහි අර්ථ, වචන සහ අක්ෂර මාලාවන්). එය කිසිවෙකු විසින් නිර්මාණය කරණ ලද්දක්ද නොවේ. සර්ව බලධාරි අල්ලාහ් වෙතින් පහළ කරන ලද්දකි.

වක්තෘවරුන් කෙරෙහි විශ්වාස කිරීම:

මවුන් අල්ලාහ් විසින් මවන ලද මුළු මිනිස් සංහතිය වෙනුවෙන් වූ දූතයන් ලෙස පහළ කළේය.

﴿رُسُلاً مُبَشِّرِينَ وَمُنذِرِينَ لِئَلاَّ يَكُونَ لِلنَّاسِ عَلَى اللَّهِ حُجَّةٌ بَعْدَ الرُّسُلِ وَكَانَ اللَّهُ عَزِيزًا حَكِيمًا﴾

*වක්තෘවරු පැමිණි පසු අල්ලාහ්ට විරුද්ධව මිනිසුන්ට සාධක කිසිවක් නොවන සේ, වක්තෘවරුන්(ස්වර්ගය ගැන) සුභාශිංසනය පවසන්නන් ලෙස හා (නිරය ගැන) අනතුරු අඟවන්නන් ලෙසද පිටත් කර හැරියේය. අල්ලාහ් සියල්ල අභිබවූ සර්වඥයා වේ.* (සූරා අල්නිසාඋ : 165)

- රසූල්වරුන්ගෙන් මුල්ම රසූල්වරයා නූහ් තුමා වේ. අවසානයා මුහම්මද් තුමා වේ.

﴿إِنَّا أَوْحَيْنَا إِلَيْكَ كَمَا أَوْحَيْنَا إِلَى نُوحٍ وَالنَّبِيِّينَ﴾

*නබිතුමනි, අප නූහ්ට සහ ඔහුට පසු පැමිණි අයට වහි පහළ කළ සේ සැබැවින්ම අප ඔබටද වහි පහළ කළෙමු.*
(සූරා අන්නිසාඋ : 163)

තවද පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේද පවසයි:

﴿مَا كَانَ مُحَمَّدٌ أَبَا أَحَدٍ مِّن رِّجَالِكُمْ وَلَكِن رَّسُولَ اللَّهِ وَخَاتَمَ النَّبِيِّينَ وَكَانَ اللَّهُ بِكُلِّ شَيْءٍ عَلِيمًا﴾

*'මිනිසුනේ, මුහම්මද් (නබි තුමා) ඔබගේ පිරිමින්ගේ කිසිවෙකුගේ පියා නොවේ. නමුදු ඔහු අල්ලාහ්ගේ වක්තෘ වරයා සහ වක්තෘවරුන්ගේ අවසාන මුද්‍රාවද වේ. තවද, අල්ලාහ් සියලු දේ කෙරෙහි ඥානවන්තයෙකුව සිටී.*
(සූරා අල්-අහ්සාබ් : 40)

☆ මුහම්මද් තුමාට පසු යමෙකු තමා වක්තෘවරයෙකු ලෙස වාද කරන්නේ නම් ඔහුද, එසේ වාද කරන්නා සත්‍ය වන්තයෙකු ලෙස පිළිගන්නා කෙනෙකුද කාෆිර් වේ. මන්දයත් ඔහු අල්ලාහ්ගේ, ඔහුගේ වක්තෘ තුමාගේ සහ මුස්ලිම්වරුන්ගේ ඒකමතික තීරණය (වක්තෘත්වය පිළිබඳ සත්‍ය සංකල්පය) ඔහු බොරු කරන්නේය.

☆ නබිවරුන් සහ රසූල්වරුන් මිනිසුන් අතරින් උතුම් සුවිපුල අය වන අතර මෙයට විරුද්ධව ආකල්පයක් දරන්නා කාෆිර් වේ.

☆ සියලුම වක්තෘවරුන් අල්ලාහ් විසින් නිර්මාණය කරන ලද මිනිසුන් වේ යනුවෙන් විශ්වාස කළ යුතුය. රුබූබිය්යත් හෙවත් මවා පෝෂණය කිරීමේ ක්‍රමය තුල ඔවුන් හට කිසිදු අයිතියක් නැත. සර්ව බල අල්ලාහ් අල්කුර්ආනයේ තම වක්තෘවරයාට මෙසේ පවසයි:

﴿قُل لَّا أَمْلِكُ لِنَفْسِي نَفْعًا وَلَا ضَرًّا إِلَّا مَا شَاءَ اللَّهُ﴾

(නබි තුමනි) පවසනු මැනවි, අල්ලාහ්ගේ මනාපය නොවන්නට සෙතක් හෝ නපුරක් හෝ කර ගැනීමට ශක්තියක් මා හට නැත (සූරා අල්අඃරාෆ් :188)

තවද පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

﴿قُلْ إِنِّي لَن يُجِيرَنِي مِنَ اللَّهِ أَحَدٌ وَلَنْ أَجِدَ مِن دُونِهِ مُلْتَحَدًا﴾

(නබිතුමනි) පවසනු මැනවි, අල්ලාහ් වෙතින් මා ආරක්ෂා කිරීමට කිසිවෙකුට නොහැකිය. තවද අල්ලාහ් හැර අන් පිළිසරණක්ද මා හට නැත (සූරා ජින් : 22)

අල්ලාහ් දෙවිඳු, මුහම්මද් තුමගේ වක්තෘත්වය තුලින් වක්තෘත්වය අවසන් කරනවද අල්ලාහ් වක්තෘ මුහම්මද් තුමාව මුළු මහත් මිනිස් සංහතියටම වක්තෘ වරයෙකු ලෙස පත් කළේය යනුවෙන් විශ්වාස කළ යුතුය.

﴿قُلْ يَا أَيُّهَا النَّاسُ إِنِّي رَسُولُ اللَّهِ إِلَيْكُمْ جَمِيعًا﴾

(නබි තුමනි) පවසනු මැනවි, මිනිසුනේ, සැබැවින්ම මා ඔබ සියල්ලන්ගේ වක්තෘ වරයා වෙමි. (අල්අඃරාෆ් : 158)

එසේම අල්ලාහ්, ඉස්ලාම් හැර අන් කිසිදු ආගමක් කිසිවෙකුගෙන් පිළිගන්නේ නැත.

﴿وَمَن يَبْتَغِ غَيْرَ الْإِسْلَامِ دِينًا فَلَن يُقْبَلَ مِنْهُ وَهُوَ فِي الْآخِرَةِ مِنَ الْخَاسِرِينَ﴾

යමෙකු ඉස්ලාම් හැර අන් ආගමක් පිළිගන්නේ නම්, අල්ලාහ් වෙතින් එය කිසිසේත් අනුමත නොකරනු ලැබේ. තවද, ඔහු අවසාන (පරමාන්ත දින)යේ නෂ්ට (අපායට නියමිත) යෙකු බවට පත් වන්නේය'. (3 : 85)

ඉස්ලාම් හැර අන් ආගම් වැළඳගන්නා කාෆිර් වේ. තවද සියලු පවෙන් මිදීමේ වරමත් වක්තෘ මුහම්මද් තුමාට හිමිය යන්නත් විශ්වාස කළ යුතුය.

## 5. පරමාත්ථ දිනය කෙරෙහි විශ්වාස කිරීම:

සසර ජීවිතය සුළු කලකින් පමණ අවසන් වන බව අප සියලු දෙනා විශ්වාස කළ යුතුය. එය විස්තර කරමින් පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿كُل مَنْ عَلَيْهَا فان . وَيَبْقَى وَجْهُ رَبِّكَ ذو الجَلال وَالإِكْرَام﴾

*එහි (විශ්වයේ) ඇති සියල්ල විනාශ වන සුළුය. මහානුභාව සම්පන්න හා සම්භාවණීය ඔබ දෙවියාගේ වන සදා පවතින්නේය.* (සූරා අර්රහ්මාන් : 26-27)

* කෙනෙකුගේ වියෝවෙන් පසු, එලොව ජීවිතයේ මුල්ම වාසස්ථානය වන මිනිවලේ සන්තාපය කෙරෙහි සම්පූර්ණ යෙන්ම විශ්වාස කළ යුතුය. ඒ සන්තාපය මිනිවලේ තැන්පත් කරන ලද තැනැත්තාගෙන් ඒ වෙනුවෙන් පත් කරන ලද සුරදූතයන් විසින් අසනු ලබන ඔහුගේ දෙවියා, ආගම සහ වක්තෘවරයා වැනි ප්‍රශ්ණ මාලාවන් වේ.

* විශ්වාසවන්තයන් හට මිනිවල සෞභාග්‍යමත් ලෙස හා අපරාධකරුවන් හට වේදනා සහගත ලෙස පවතින බවට විශ්වාස කළ යුතුය.

* අවසන් දිනය කෙරෙහිද අප විසින් විශ්වාස කළ යුතුව ඇත. එය මල අය නැවත නැගිටවනු ලබන දිනයයි. එනම් එදින අල්ලාහ්, මිය ගියාවූ සියලු දනන් නැවත පනපොවා සොහොනින් නැගිටවනු ඇත. පසුව ඔවුන්ගේ ක්‍රියාකලාපයන් ගැන විවෘතව විමසීමෙන් පසු ප්‍රතිඵල ලබා දෙනු ලබනු ඇත. එනම් පින්වතුන්ට ස්ථිර ස්වර්ගයත් පවකරුවන්ට නිරයත් ඵලවිපාක ලෙස ලබනු ඇත.

﴿وَنُفِخَ فِي الصُّورِ فَصَعِقَ مَن فِي السَّمَاوَاتِ وَمَن فِي الأَرْضِ إِلا مَن شَاء اللَّهُ ثُمَّ نُفِخَ فِيهِ أُخْرَى فَإِذَا هُم قِيَامٌ يَنظُرُونَ﴾

සූර් (නම් කාහළය) පිඹීමෙන් අනතුරුව අල්ලාහ්ගේ මනාපයට පාත්‍රාවූ සියල්ලන් (හැරෙන්න) අහසේ සහ පොළොවේ (අත්) සියල්ල සිහිමුර්ජා වනු ඇත. නැවත වරක් පිඹිණු ලබනු කළ ඔවුන් සියල්ල නැවත නැගිට පෙරටු වී සිටිනු ඇත. (සූරා අල්-සුමර් : 68)

* මෙම දිනය එළඹෙන්නට පෙර පූර්ව සළකුණු සමහරක් වෙ. ඒදිනය එළඹෙන්නට පෙරවූ පූර්ව සාධකයන් සහ සාක්ෂීන්ද බොහෝ වෙ.

* ඒ දිනය සම්බන්ධව අල්කුර්ආනයේ සහ හදීස්හී සඳහන්වී ඇති සියලු විස්තර සහ බේදවාචකයන් ගැන වූ කරුණු ඒ ආකාරයෙන්ම පිළිගත යුතුය.

6. පූර්ව සැළැස්ම (දෛවය) කෙරෙහි විශ්වාස කිරීම:

* මෙම විශ්වය තුල සිදුවන හොඳ සහ නොහොඳ සියල්ල අල්ලාහ්ගේ පූර්ව සැළැස්ම මත සිදුවන්නේය. අල්ලාහ්ගේ පූර්ව දැනුම අනුව සහ තීරණය අනුව ඒවා සිදුවන බව විශ්වාස කළ යුතුය. එබැවින් මතු සඳහන් ආකාරයට ඒවා විශ්වාස කළ යුතුව ඇත.

* යමක් සිදුවීමට පෙර එය සිදුවන ආකාරය පිළිබඳ අල්ලාහ්ගේ දැනුම.

* එසේ සිදුවන සියලු දේ ඔහු වෙත ඇති ලව්හුල් මහ්ෆූළ් නම් ආරක්ෂිත පුවරුවෙහි ලියවී ඇත.

* ඔහු සියලු දේ නිර්මාණය කරයි. අති උත්කෘෂ්ඨ ඔහු සිතූ දේ කිරීමට අති බලවතාය.

* ඔහු සිතූ පැතූ දේ සිදුවිය. ඔහු නොසිතූ දේ නොසිදු විය. ඔහු සිතූ දේ හැර අන් කිසිවක් සිදු නොවෙ. ඔහු සියලු දේ කෙරෙහි බලසම්පන්නයාද වෙ.

## විශ්වාස ප්‍රතිපත්ති සම්බන්ධ තවත් සමහර කරුණු:

* අදෘශ්‍යමාන දැහී දැනුම අල්ලාහ් හැර අන් කිසිවෙකු නොදනී.

* දෛවඥයින් සහ නවවස්ත්‍ර එලාපල කියන්නන් සත්‍ය වන්තයන් ලෙස පිළිගන්නේ කවරෙක්ද ඔහු කාෆිර් වේ. තවද, ඔවුන් හමුවට යෑම විශාල පාපීය ක්‍රියාවට අයත්වේ.

ආගම අනුමත නොවූ දෙයින් බරකත් හෙවත් ආශිර්වාද හෝ අනුහස අපේක්ෂා කිරීම : ඉස්ලාම් ධර්මයේ අනුමත කරන ලද දෙයින් හැර අන් ක්‍රමයකින් එසේ අපේක්ෂා කිරීමට මුස්ලිම්වරයෙකුට නොහැකිය.

වසීලා ප්‍රාර්ථනාවන් : සුද්ධවූ අල්කුර්ආනයේ සඳහන්වී ඇති වසීලා හෙවත් උදව් උපකාර පැතීම සහ සමීපවීම එනම් ඉස්ලාම් ආගම අනුමත කරනු ලද වැඳුම්පිදුම් වලින් අල්ලාහ්ට යටහත්භාවය දැක්වීම හා ඔහුට සමීප වීමයි.

අනුමත වසීලා : අල්ලාහ්ගේ නාමයන් හා ගුණාංගයන් මුල්කර ගෙන අයදින ප්‍රාර්ථනාවන් හා ආයාචනයන්. (උදාහරණයක් : නිත්‍ය ජීවය ඔබගෙන් ආරක්ෂා පතමි.)

එසේ නොවන්නට, තමා කළ පුණ්‍ය කර්මයක් පෙරටු කර ඇසිය යුතුය. (උදාහරණයක් වශයෙන් : දෙවියනි, මා දෙමාපියන් හට කළ ඇපඋපස්ථාන කර්මයන් පෙරටු කර ඔබගෙන් උදව් පතමි. පව් සමා අයැදිමි. ආරක්ෂා පතමි). එසේ නොවන්නට ජීවතුන් අතර සිටින දැහැමි පුද්ගල යෙකුගෙන් තමා වෙනුවෙන් ප්‍රාර්ථනාවන් කරන ලෙස ඉල්ලා සිටීම.

ආගම අනුමත නොකළ නූතන වසීලා - බිද්ආ :

ඒවා කලකට පෙර නැසීගිය වක්තෘවරුන් හෝ ජීවතුන් අතර නොවන අනෙකුත් දැහැමි පුද්ගලයන් පිහිටෙන්

හෝ මවුන්ගේ සොහොන් වෙත ගොස් හෝ නොවන්නට මවුන්ගේ තරාතිරම හෝ මහිමය හෝ ඉදිරිපත් කරමින් මවුන් පෙරටු කර ඉල්ලන ප්‍රාර්ථනාවන් වේ.(උදාහරණයක් වශයෙන්: නබි තුමාගේ මහිමය මත හෝ සමහර මුස්ලිම් දේවස්ථානවල නැසී සොහොන් ගතවී ඇති දැහැමි පුද්ගල යෙකු හෝ දෙවගැත්තන් හෝ පෙරටුකර ආයාචනා කිරීම)

වසීලාහී ෂිර්ක් (ආදේශ කිරීම): නැසීගිය කෙනෙකුගෙන් හෝ ඔහු අතරමැදියෙකු ලෙස පත්කර උදව් උපකාර, ආරක්ෂාව සහ පවසමා වැනි දේ ඉල්ලීම. (උදාහරණයක් ලෙස : නබි තුමාගෙන් ඉල්ලා සිටීම හෝ නැසීගිය සමහර දෙවගැත්තන් අමතා පිහිට පැතීම)

☆ අල්කුර්ආනය අනුව හෝ නබි තුමාගේ සුන්නා සංකල්පය අනුව හෝ ස්වර්ගයට අයත් වූවන් වශයෙන් හා නිරයට අයත් වූවන් වශයෙන් ස්ථිර කරන ලද අය හැර මුස්ලිම්වරයෙකු ස්වර්ගයේ වැසියෙක් හෝ නිරයේ වැසියෙකු ලෙස සිථිරව කීමට කිසිවෙකුට නොහැකිය.

☆ ෂිර්ක් හෝ කුෆ්ර් නොවන්නට කෙනෙකු විශාල පවක් කළ විට ඔහුගේ සත්‍ය විශ්වාසය හෙවත් ඊමානය ඔහු ගෙන් බැහැර නොවන්නේය. නමුදු ඔහුගේ එවන් ක්‍රියාව අනුව ඊමාන් මෙලොවෙහි අඩුවැඩි වන්නේය. අල්ලාහ්ගේ මනාපය අනුව එලොවද අඩු වැඩි වන්නේය. අල්ලහ් මනාප අනුව ඔහුට සමාවිය හැකිය, නොවන්නට ඔහුට අඩුවම් ලබා දෙනු ලබනු ඇත.

☆ ඉස්ලාම් ආගම වෙනුවෙන් උදාර ලෙස සුවිශාල පරිත්‍යාගයක් කළ නබි තුමාගේ කළණ මිතුරන් වන සහාබාවරු සියලු දෙනා මුහම්මද් තුමාට පසු මෙම සමාජයේ යහමග ලද්දන් හා උතුම් අය වෙති. මවුන් කෙරෙහි ප්‍රියමනාප දැක්වීම ඊමාන් සහ ඉස්ලාමයට අදාළ

කරුණකි වෙ. මවුන්ට හිමි කීර්තිමත් දේහැරෙන්නට අන් කිසිවක් නොපවසිය යුතුය. මවුන්ගෙන් අබූබක්ර් බින් සිද්දීක්, උමර් බින් කත්තාබ්, උස්මාන් බින් අෆ්ෆාන් සහ අලී බින් අබීතාලිබ් වැන්නන් පිළිවෙලින් ප්‍රධාන අය වෙ.

☆ නබි තුමාගේ පවුලේ අය කෙරෙහි ප්‍රියමනාප වීමද ආගමේ කොටසකි. මවුන් වන්නේ එතුමාගේ බිරිඳන්, පියාගේ සහෝදරයන් සහ මවුන්ගේ පුතුන් වැනි ඉස්ලාමය වැළඳගත් එතුමාගේ ඥාතීන්ය.

☆ මුහම්මද් තුමා ඉදිරිපත් කළ දෙයින් යමක් අපහාසයට ලක් කරන්නේ නම් හෝ සුළු කොට තකන්නේ නම් හෝ අල්ලාහ් සහ මුහම්මද් තුමා නිග්‍රහ කර අවමාන කරන්නේ නම් හෝ මහු කාෆිර් වරයෙකු ලෙස වෙ.

☆ කොඩිවින කිරීම, ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම සහ ඒවා විශ්වාස කර පිළිගැනීමද කුෆ්ර් වෙ. (හූනියම් කරන අය වෙත යෑම, මවුන්ට උදව් කිරීම, කෙනෙකු ලවා තම හතුරෙකුට හූනියමක් කිරීමද එහි අඩංගු වෙ.)

2. <u>වන්දනාමානඃ</u>

පිරිසිදුවඃ පිරිසිදුව කොටස් දෙකකි.අ. අපිරිසිදු දෙයින් පිරිසිදු වීම : සලාත් කිරීමට ඉදිරිපත් වන්නාගේ ශරීරය, මහු සලාත් කිරීමට තෝරා ගන්නා ස්ථානය සහ මහු ඒ වෙනුවෙන් ඇඳුම වැනි සියල්ල නජීස් හෙවත් අපිරිසිදුවෙන් ඉඳුරාම ඉවත්වී තිබිය යුතුය. (උදාහරණයක් වශයෙන් මල මුත්‍රා සහ ලේවැනි දේ)

ආ : කිල්ලෙන් පිරිසිදු වීම. එය කොටස් දෙකකි.

1. සුළු කිළිට : එනම් වුළු දෝවනය නිශ්ප්‍රභා කරන මල මුත්‍රා පිටවීම සහ වාතය පිටවීම.

2. මහා කිල්ල : නෑම අනිවාර්යය කරන කරුණු (එනම් මාසික මසපය, ප්‍රශව රුධිරය සහ ධාතු පිටවීම)

මලමුත්‍රා පිටවීම, වාතය පිටවීම, මටුමස් අනුභව කිරීම සහ තද නින්ද වැනි සුළු කිලි අවස්ථාවන් ඇති වූ විට සලාත් නැමදුමට පෙර වුළු කිරීම අනිවාර්යය වේ.

වුළු (දෝවනය) කරන පිළිවෙළ :

1. වුළු වෙනුවෙන් චේතනා කිරීම. මෙය වචනයකින් කීමට උවමනා නැත.

2. بِسْمِ اللهِ බිස්මිල්ලාහ් යනුවෙන් පවසමින් දැත් මැණික් කටුව දක්වා තුන් වතාවක් සේදීම.

3. කට තුන්වරක් සේදීම සහ නාස්පුඩු පිරිසිදු කිරීම.

4. මුහුණ තුන්වරක් සේදීම (එක් කන්පෙත්ත සිට අනෙක් කන් පෙත්ත දක්වාද නළලේ හිස කෙස් පටන් ගන්නා ස්ථානයේ සිට උගුර දණ්ඩ දක්වා වූ ස්ථානය මුහුණ ලෙස සැළකේ.)

5. පළමුව දකුණු අතද පසුව වමතද සේදිය යුතුය. දැත් ඇඟිලි තුඩ සිට වැලමිට ඇතුළුව තුන් වරක් සේදිය යුතුය.

6. පසුව ජලය තවරා තෙත් අතෙන් හිස පෙර සිට පිටුපස දක්වාද, පිටුපස සිට පෙර නළල දක්වාද පිරිමැදිය යුතුය.

7. පසුව දබරැඟිල්ල දෙකන් සිදුරුවලට ඇතුල් කර දෙකන් පෙති පිරිමැදිය යුතුය.

8. පසුව වළලුකරය දක්වා දෙපා තුන්වරක් සේදිය යුතුය. පළමුව දකුණද පසුව වමද සේදිය යුතුය.

6. අනිවාර්ය නෑම:

මාසික සුධිය, ප්‍රශව රුධිරය, කායික සංසර්ගය සහ අන් විධියකින් ධාතු පිටවීම වැනි මහ කිලි අවස්ථාවන්හි නෑම අනිවාර්යය වේ.

ජලස්නානය කරන පිළිවෙළ:

1. පළමුව නියයත් (චේතනාව) කළ යුතුයි.
2. බිස්මිල්ලා යනුවෙන් පවසා සම්පූර්ණ ලෙස වුළු දොවනය කළ යුතුය.
3. පසුව තුන් වරක් හිසට ජලය වත්කළ යුතුය.
4. පසුව මුළු දේහයම සම්පූර්ණව තෙමෙන අයුරු ජලය වත්කළ (නා ගත) යුතුය.

7. තයම්මුම් : ජලය නොලැබෙන අවස්ථාවකදී හෝ ජලය පාවිච්චි කළ නොහැකි අවස්ථාවකදී හෝ වුළු සහ අනිවාර්යය නෑම වෙනුවට දූවිලි සහිත පස් මගින් කෙරෙන පිරිමැදීමට තයම්මුම් යනුවෙන් හැඳින්වෙ.

තයම්මුම් කරන පිළිවෙළ : පළමුව, වුළු හෝ අනිවාර්යය නෑම කරණ අවස්ථාවන්හි කරනා අයුරු නියයත් කළ යුතුය. පසුව පිරිසුදු පසෙහි හෝ බිත්තිය මත දෙඅත් තබා ඉක්බිති ගසා පළමුව මුහුණේ පිරිමැද පසුව එක් අත අනෙක් අතේ පිටතේ පිරිමැදිය යුතුය.

හයිළ් : ස්ත්‍රියගේ මාසික ඔසපය වෙ.

නිෆාස් : දරු ප්‍රසූතියෙන් පසු පිටවන රුධිරය.

හයිළ් සහ නිෆාස් අවස්ථාවේ කෙනෙකු නොකළ යුතු ඒවා :

1. කායික සංසර්ගය.
2. නැමදුම, උපවාසය සහ කඃබා ප්‍රදක්ෂිණාව. (පිරිසිදු වීමෙන් පසු අතපසුවූ උපවාස ශීලය නැවත සම්මාදම් විය යුතු අතර සලාත් නැවත කිරීමට උවමනා නැත.
3. සුද්ධවූ කුර්ආනය ඇල්ලීම සහ කියවීම.
4. දේවස්ථානය තුල රැඳී සිටීම.
5. පිරිමියෙකු හයිළ් හෝ නිෆාස්හි පසුවන තම බිරිඳ දික්කසාද කිරීම.

සලාත් : යමෙකු ඉස්ලාම් ආගම පිළිගෙන සාක්ෂි දැරීමෙන් පසු ඉටුකළ යුතු අනෙක් ප්‍රධානතම ආගමික කරුණ වන්නේ දෛනික නැමදුම ඉටුකිරීම වේ. එය ඉස්ලාමීය දෙවැනි කුළුණ වේ. දෛනික දේවනැමදුම මුළුමනින්ම අත්හරින්නා මුස්ලිම්වරයෙකු ලෙස පිළිගැනීමට නොහැක.

නැමදුම ඉටුකරන කළ එහි සියලුම නීතිරීති සහ කොන්දේසි හරියාකාරව පිළිපදිනා තුරු නැමදුම සම්පූර්ණ නොවන්නේය. සලාත් හෙවත් දේවනැමදුම ඉටුකිරීම සම්බන්ධව නබිතුමාගේ ආදර්ශය පිළිපැදිය යුතුය.

නැමදුම සඳහාවූ පූර්ව කොන්දේසි (ෂර්ත්) :

මතු සඳහන් කරුණු දේවනැමදුම පිණිස පූර්වව සම්පූර්ණ විය යුතු ඒවා වේ. ඉස්ලාම් දහම අනුමත කළ නිදහස් කරුණුවලින් තොරව ඒවා සම්පූර්ණ නොවන්නට දේවනැමදුම කිසිවිටෙක අනුමත නොවේ.

- සුළු කිල්ලෙන් මිදීම: වුළූ දෝවනය. (වුළූ දොවනය නිෂ්ප්‍රභා කරන දේවලින් වැළකිය යුතුය)
- මහ කිල්ලෙන් මිදීම : අනිවාර්ය නෑම (ධාතු පිටවීම, මාසික මසප්වීම, ප්‍රසූති රුධිරය සහ කායික සංසර්ගය)
- නැමදුම සඳහාවූ නියමිත වේලාව පැමිණීම : නියමිත වේලාව එළඹෙන්නට පෙර නැමදුම කිරීම තහනම් වේ.
- නියියත් හෙවත් චේතනාව : කෙනෙකු දේවනැමදුම වෙනුවෙන් සිට ගත් කළ ඒ ඒ දේවනැමදුම වෙනුවෙන් අධිෂ්ඨානය කර ගත යුතුය. (වචනවලින් නොව.)
- ඉස්ලාම් අනුමත ඇඳුමෙන් සැරසී සිටීම : (පිරිමින් නාභියේ සිට දණහිසට පහළවූ කොටසද, ස්ත්‍රීන් මුහුණ සහ දෑත් හැර අන් කොටසද, ආවරණය කළ යුතුය)
- කිබ්ලා දිසාවට වෙත මුහුණ ලෑම : කිබ්ලාව හැර අන් කිසිදු දිසාවකට මුහුණ හැරවීම තහනම් වේ.

## නැමදුම කරන පිළිවෙළ:

▸ ඒ ඒ වේලාවට කළයුතු නැමදුම අනුව කිබ්ලාව දෙසට මුහුණ ලා සිට ගත යුතුය.(කිබ්ලාවට මුහුණ හැරවීම වාජිබ් වේ). හැකි අය සිටගෙන නැමදුමෙහි යෙදීම නැමදුමේ ප්‍රධාන කොන්දේසියකි.

▸ اَللهُ اَكْبَرُ ‘අල්ලාහු අක්බර්’ යනුවෙන් මුල් තක්බීරය කීම (මුල්ම තක්බීරය අනිවර්යය වේ. අන් සියල්ල වාජිබය).

▸ පසුව දකුණත වමත මත තබමින් දැත් පපුව මත තබා ගත යුතුය (මෙය සුන්නා වේ).

▸ තක්බීර් අල් ඉහ්රාම්: (මුල්ම තක්බීර්)හි සූරා ෆාතිහා පාරායනය කිරීම තවත් අනිවාර්යය කරුණක් වේ. පසුව මනාපය පරිදි අල්කුර්ආනයෙන් සුලු සූරාවක් පාරායනය කළ හැකිය.

▸ اَللهُ اَكْبَرُ ‘අල්ලාහු අක්බර්’ යනුවෙන් පවසමින් රුකූඋ අවස්ථාවට පත්වීම. (හිස සහ පිට, කොන්ද හා සමානවන සේ දණහිස් මත දැත් තබා පහත්වීම) එහිදී سُبْحَانَ رَبِّيَ الْعَظِيْمِ ‘සුබ්හාන රබ්බියල් අළීම්’ යනුවෙන් තුන්වරක් පැවසිය යුතුය. නැමදුමෙහි රුකූඋ ෆර්ළ් වේ. එහි සුබ්හාන රබ්බියල් අළීම්’ යනුවෙන් පැවසීම වාජිබ් වේ.

▸ පසුව سَمِعَ اللهُ لِمَنْ حَمِدَهُ ‘සමිඅල්ලාහු ලිමන් හමිද’ යනුවෙන් පවසමින් පෙර සේ සිට ගත යුතුය. ඉමාම් හා ඒකාබද්ධ නැමදුමේ යෙදෙනවා නම් ඉමාම් එසේ පැවසීමෙන් පසු رَبَّنَا لَكَ الْحَمْدُ ‘රබ්බනා ලකල් හම්ද්’ යනුවෙන් අනුපිළිපදින්නන් පැවසිය යුතුය.

▶ اَللهُ اَكْبَـــرُ අල්ලාහු අක්බර් යනුවෙන් පවසමින් දේහයේ සත්පොලක් පොළොවෙ පතිත වන අයුරු සජ්දා කිරීම. මෙය අනිවාර්යය කරුණකි. (දෙපා ඇඟිලි, දෙදණහිස්, දෑත් සහ නළල සමග නාසය) සජ්දාහි سُبْحَانَ رَبِّيَ الأَعْلَى 'සුබ්හාන රබ්බියල් අඃලා' යනුවෙන් තුන් වරක් පැවසිය යුතුය. (එය වාජිබ්වෙ).

▶ اَللهُ اَكْبَرُ 'අල්ලාහු අක්බර්' යනුවෙන් පවසමින් සජ්දා සිට නැගිට වාඩි විය යුතුය. එසේ වාඩිවීම අනිවාර්යය වෙ. එහිදී رَبِّغْفِرْلِي 'රබ්බිග්ෆිර්ලී' යනුවෙන් පැවසීම වාජිබ් වෙ.

▶ පසුව اَللهُ اَكْبَرُ 'අල්ලාහු අක්බර්' යනුවෙන් පවසමින් පෙර කළ සජ්දා සේම දෙවැනි සජ්දාව කළ යුතුය. ඒහා නැමදුමෙහි රකඅතයක් (පියවරක්) අවසන් වෙ.

▶ اَللهُ اَكْبَرُ 'අල්ලාහු අක්බර්' යනුවෙන් පවසමින් නැවත වරක් සිටගෙන පෙර සේම රකඅතයක් නිම කළ යුතුය. එය දෙවැනි රකඅතය (පියවර) යනුවෙන් සඳහන් වෙ.

▶ ෆජ්ර් සහ ජුම්ආ වැනි අනිවාර්යය නැමදුමත් රකඅත් දෙකෙන් සමන්විත නැමදුමක් නම් දෙවැනි රකඅතයේ දෙවැනි සජ්දාවෙන් පසු ආසසු නොනැගිට තෂහ්හුද්හි වාඩි විය යුතුය. එහිදී

اَلتَّحِيَّاتُ لِلّـــهِ وَالصَّلَوَاتُ وَالطَّيِّبَـــاتُ ، اَلسَّلاَمُ عَلَيْكَ أَيُّهَا النَّبِيُّ وَرَحْمَـــةُ اللهِ وَبَرَكَاتُهُ ، اَلسَّلاَمُ عَلَيْنَا وَعَلَى عِبَادِ اللهِ الصَّالِحِيْنَ ، أَشْهَدُ أَنْ لا إِلَهَ إِلاَّ اللهُ وَأَشْهَدُ أَنَّ مُحَمَّداً عَبْدُهُ وَرَسُوْلُهُ .

'අත්තහිය්යාතු ලිල්ලාහි වස්සලවාතු වත්තය්යිබාතු අස් සලාමු අලෙයික අය්යුහන් නබිය්යු වරහ්මතුල්ලාහි

වබරකාතුහු අස්සලාමු අලෙයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්. අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහූ' යන තෂහ්හුද් පැවසිය යුතුය.

සලවාතුල් ඉබ්රාහිමියියා හෙවත් මතු සඳහන් කොටසද පාරායනය කළ යුතුය.

اَللّٰهُمَّ صَلِّ عَلَى مُحَمَّدٍ وَعَلَى آلِ مُحَمَّدٍ كَمَا صَلَّيْتَ عَلَى إِبْرَاهِيْمَ وَعَلَى آلِ إِبْرَاهِيْمَ إِنَّكَ حَمِيْدٌ مَّجِيْد ، وَبَارِكْ عَلَى مُحَمَّدٍ وَعَلَى آلِ مُحَمَّـــدٍ كَمَـــا بَارَكْتَ عَلَى إِبْرَاهِيْمَ وَعَلَى آلِ إِبْرَاهِيْمَ إِنَّكَ حَمِيْدٌ مَّجِيْد ،

'අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත අලාඉබ්රාහීම වඅලාආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්. වබාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම් මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආල ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්'. (සලාතයේ අවසානයේ සලවාතුල් ඉබ්රාහිමිය්යා හා තෂහ්හුද්ද උසුරීම අනිවාර්යය වෙ)

◗ සලාත් නිම කරනු වස් මුලින් දකුණටද පසුව වමටද اَلسَّلاَمُ عَلَيْكُمْ وَرَحْمَةُاللهِ 'අස්සලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහ්' යනුවෙන් සලාම් කළ යුතුය. සලාම් කිරීම ෆර්ළ් වෙ.

◗ මග්රිබ්, දුහර්, අස්ර් සහ ඉෂා වැනි රක්අත් තුනෙන් හෝ හතරෙන් හෝ සමන්විත නැමදුමන් කරන විට දෙවැනි රක්අත් අවසානයේ තෂහ්හුද්හි වාඩිවී තෂහ්හුද් කීම වාජිබ් වෙ. පසුව اَللهُ اَكْبَرُ 'අල්ලාහු අක්බර්' යනුවෙන් පවසා නැගිට ඉතිරි තුන්වන හෝ තුන්වන සහ සිවවැනි රක්අත් අවසන් කළ යුතුය. පසුව තෂහ්හුද්හී අවසාන කොටසද වන සලවාතුල් ඉබ්රාහිමියියාද උසුරා සලාම් කිව යුතුය.

- නැමදුමෙහි අවශ්‍ය කටයුතු අනුපිළිවෙළින් ඉටු කළ යුතුය. එසේ ඉටුකිරීම අනිවාර්යය (ෆර්ළ්) ක්‍රියාවකි.
- නැමදුමෙහි සියලු කටයුතු ඉක්මන් නොවී සාවදානව කිරීමද තවත් අනිවාර්යය (ෆර්ළ්) ක්‍රියාවකි. (සලාත් අවසන් කළ පසු උසුරිය යුතු සමහර ප්‍රාර්ථනාවන් මුහම්මද් තුමා පහදා දුන්හ. ඒවා සලාත් සම්බන්ධ පොත්පත්වලින් අධ්‍යයන කර ගැනීම වැදගත්ය)

නැමදුමට අදාළ අනිවාර්ය කරුණු:

නැමදුමෙහි කළයුතු අනිවාර්යය ක්‍රියාවක් දැනගෙන හෝ වැරදීමකින් හෝ අත් හැරීමෙන් නැමදුම මුලුමනින්ම අවලංගු වේ. නැමදුමට අදාළ වාජිබයක් උවමනාවෙන් කෙනෙකු පැහැර හැරියේ නම් ඔහුගේ නැමදුම නිෂ්ප්‍රභා වේ. අමතක වීමකින් හෝ අනපසුවීමකින් හෝ අත් හැරෙන්නේ නම් එයට නැමදුම අවසානයේ සජ්දාසහ්වු කළ යුතුය.(එනම් සුජූද් දෙකක් කළ යුතුය)

නැමදුම නිෂ්ප්‍රභා කරන කරුණු :

- අනිවාර්යය දෙයක් නොකිරීම සහ දැනදැනම වාජිබ් ක්‍රියාවක් අත් හැරීම.
- නැමදුම් අවස්ථාව තුල දැනුවත්ව අන්නපානය කිරීම.
- නැමදුමට අදාළ නොවන කතා හෝ කියවීම.
- වුළු අවලංගු වන යම් දෙයක් සිදුවීම.
- නුවුවමනාවෙන් නුසුදුසු ක්‍රියාවන් අඛණ්ඩව යෙදීම.
- කිබ්ලා දෙසින් සම්පූර්ණව ඉවත් වීම.
- නැමදුම අවස්ථාවේ සිනාසීම.
- රුකුඋ, සුජූද් සහ නැගිටීම වැනි දේ දැන දැනම අඩුවැඩියෙන් කිරීම.
- නැමදුම් කරනවිට ඉමාම්ට පෙර ක්‍රියා කිරීම.

## නැමදුම් වේලාවන්

| නැමදුම | රක්අත් | වේලාවන් |
|---|---|---|
| ෆජ්ර් | 2 | පසර අළුයම සිට ඉර පායනතුරු |
| දුහර් | 4 | ඉර මුදුනෙන් ඇලවූ අවස්ථාව සිට යම් වස්තුවක සෙවනැල්ලක් ඒ හා සමාන වනතුරු |
| අසර් | 4 | යම් වස්තුවක සෙවනැල්ලක් ඒ වස්තුව හා සමානවූ අවස්ථාවේ සිට ඉර බසින වේලාව වනතුරු |
| මග්රිබ් | 3 | ඉර බැස යැමෙන් පසු වේලාව සිට අහස රත්පැහැ වන තුරු |
| ඉෂා | 4 | උහස රත්පැහැ වූ වේලාවේ සිට මධ්‍යම රාත්‍රිය දක්වා |

නැමදුම සම්බන්ධ තවත් සමහර වැදගත් කරුණු:

1. පිරිමින් ජමාඅත් හා මස්ජිදයේ නැමදුම කළ යුතුය. කාන්තාවන් මස්ජිදයට යැම අනිවාර්ය නැත.
2. පිරිමින් වඳින්නට පෙර අදාන් සහ ඉකාමා ඉතා අවශ්‍යය. කාන්තාවන්ට අනිවාර්යය නැත.
3. **අදාන්** : (නැමදුම පිණිස ඇමතීම)

අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර්
අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර්
අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ්
අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ්
අෂ්හදු අන්න මුහම්මදුර් රසූලුල්ලාහ්
අෂ්හදු අන්න මුහම්මදුර් රසූලුල්ලාහ්
හයියඅලස්සලාහ් හයියඅලස්සලාහ්
හයියඅලල්ෆලාහ් හයියඅලල්ෆලාහ්
අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර් ලාඉලාහ ඉල්ලල්ලාහ්

ෆජ්ර්හී අදානයේ පමණක් හයියලල් ෆලාහ් පැවසූවාට පසු

الصلاة خـير مـن النـوم අස්සලාතු කයිරුම් මිනන් නවම් යනුවෙන් දෙවරක් එක්කර පැවසිය යුතුය.

4. **ඉකාමා:** අල්ලාහුක්බර් අල්ලාහු අක්බර්
අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ්
අෂ්හදු අන්න මුහම්මදර් රසූලුල්ලාහ්
හයියඅලස්සලාහ් හයියඅලල්ෆලාහ්
කද්කාමතිස්සලාත් කද්කාමතිස්සලාත්
අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර් ලාඉලාහ ඉල්ලල්ලාහ්
(සෑම අනිවාර්ය නැමදුමකදීම ඉකාමා පැවසිය යුතුය.)

**ජුම්ආ නැමදුම :**

ජුම්ආ නැමදුම වැඩිවියට පත්වූ සියලු පිරිමින් කෙරෙහි අනිවාර්යය වේ. පරිශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿يَا أَيُّهَا الَّذِينَ آمَنُوا إِذَا نُودِيَ لِلصَّلَاةِ مِن يَوْمِ الْجُمُعَةِ فَاسْعَوْا إِلَىٰ ذِكْرِ اللَّهِ وَذَرُوا الْبَيْعَ﴾

*විශ්වාසවන්තයිනි, ජුමුආ දිනයේ නැමදුම පිණිස කැඳවන ලද්දේ නම් වෙළඳාම නතර කර අල්ලාහ් සිහිකරනු වස් (දේවස්ථානයට) වහා පියමං කරව.* (අල්ජුමුආ : 9)

ජුමුආ නැමදුම සිකුරාදා දිනයේ ලුහර් නැමදුම වෙනුවට ඉමාම්ගේ විශේෂ දේශනයකින් පසු රක්අත් දෙකකින් අනිවාර්යය සමන්විත නැමදුමකි. නෑ පිරිසිදු වී, පිරිසිදු ඇඳුමකින් සැරසී, සුවඳ විලවුන් ඇත්නම් ඒවා තවරා නියමිත වෙලාවට පෙර මස්ජිදය තුලට පිවිසීම අගනේය. ඉමාම් දේශනය පටන් ගත් පසු කතා කිරීම නුසුදුසුය. ඒ අවස්ථාවේ වෙළඳ ගනු දෙනු කිරීම සහ වාතිය වැනි කටයුතු කිරීමද තහනම්ය. ජුම්ආ නැමදුම කාන්තාවන් හට අනිවාර්ය නොවේ.

අවුරුදු දින නැමදුම: (ඊදුල් ෆිත්ර් සහ ඊදුල් අළ්හා අවුරුදු): (ඊදුල් ෆිත්ර් යනු උපවාස ශීලය අවසන් කිරීමෙන් පසු ෂව්වාල් මාසයේ පළමුවන ලාසඳ දැකීමෙන් පසු පසුදා සමරණ අවුරුදු වන අතර ඊදුල් අළ්හා යනු හජ් මාසයේ දහවන දිනය සමරණ අවුරුද්ද වෙ. (පරිවර්තකයා)

මෙම නැමදුම් දෙක සුන්නතුල් මුඅක්කදා (නබි තුමා විසින් නොකඩවා ඉටු කරන ලද) නැමදුම වෙ. සමහර පඬිවරුන් එය වාජිබ් යයි පවසති. පිරිමින් මෙන්ම ස්ත්‍රීන්ද එයට සහභාගි විය යුතුය. එදින නෑ පිරිසිදුවී අළුත් ඇඳුම් ඇත්නම් එයින් සැරසී, තිබේනම් සුවඳ විලවුන් තවරා නැම දුම් ස්ථානයට යා යුතුය. ඊද් දිනයේ පෙරදින සවස සිට තක්බීර් පැවසිය යුතුය. ඊදුල් අළ්හා (හජ් අවුරද්ද) දිනයේ දවස් තුනක්, එනම් සිව්වනදාට පෙර සන්ද්‍යාව එළඹෙන තුරු තක්බීර් කීම වැදගත්ය. ඊදුල් ෆිත්ර් දිනයේ පෙර දින සැන්දෑවෙ සිට ඉමාම් (නැමදුම කරන) මුසල්ලාවට ඇතුල්වන තුරු තක්බීර් පැවසිය යුතුය. තක්බීර්:

الله أكبر الله أكبر، لا إله إلا الله ، والله أكبر الله أكبر ولله الحمد.

අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර්, ලාඉලාහ ඉල්ලල්ලාහ්, අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර් වලිල්ලාහිල් හම්ද්.

**ජනාසා (මුස්ලිම් මරණයකට අදාළ) නීතිරීති :**

මුස්ලිම්වරයෙකු මරණයට පත්වීනම් උස් හඬින් හැඬීම හෝ විලාප නැගීම තහනම්ය. මුහම්මද් නබි තුමා දෙසූහ: 'යමෙකු මැරුණු කෙනෙකු වෙනුවෙන් විලාප නගා හඬන්නේ නම් මරණයටද ඒ හා සමාන වේදනා පමුණුවනු ඇත'. තම දුක සාංකාව ප්‍රකාශ වනසේ සාමාන්‍යය ලෙස හැඬීම ආගමේ අනුමතයි.

කාන්තාවක් තම නැසීගිය ස්වාමි පුරුෂයා වෙනුවෙන් සිව් මසක් සහ දින දහයක් ඉද්දා නම් තනි ආරක්ෂාව

රැකිය යුතුය. ඒ හැර අනෙක් කාන්තාවක් තෙදිනකට අධිකව දුක්වීම ඉස්ලාම් කිසිවිටෙක අනුමත නොකරයි.

ඉද්දා අවස්ථාවේ නොකළ යුතු දේ:

* වැදගත් හේතුවක් නොවන්නට ඇය නිවසින් පිටවීම නොකළ යුතුය.

* අනුන්ගේ සිත් පිනවන අයුරු විලාසිතාවට අනුව ඇඳුම් ඇඳීම සහ සුවඳ විලවුන් තැවරීම.

* ඉද්දා කාලය තුල ඇය නැවතත් විවාහ වීම, විවාහ කටයුතු ගැන කතා කිරීම ඉඳුරාම තහනම්ය.

මෘතදේහයක් සේදීම:

මරණයට පත්වූ කෙනෙකුගේ දේහය භූමදානය පිණිස දෝවනය කිරීම වාජිබ්ය.

දේහය සේදීම:

1. මුළු දෙහයම තෙත්වන අයුරු ජලය වත්කළ යුතුය. ජලය මුළු දේහය පුරා තැවරීම වැදගත්ය.

2. නැමදුමට වුළු කරන සේ මෘතදේහය වුළු කරවීම උචිත ක්‍රියාවකි. පසුව තුන් වතාවක් සේදිය යුතුය.

3. ජලයෙන් සේදිය නොහැකි අයුරු දේහය විකෘති වී ඇත්නම් නැමදුම් පිණිස තයම්මුම් කරන අයුරු මිනිය ක්‍රමිකව තයම්මුම් කළ යුතුය.

4. පිරිමි දේහය, පිරිමි අය දෝවනය කළ යුතු අතර, පිරිමියෙකු තම බිරිඳගේ දේහය සේදිය හැකිය. ස්ත්‍රී මරණයක් නම් ස්ත්‍රීන් විසින් සේදිය යුතු අතර සිය ස්වාමියාගේ දේහය තම බිරිඳ විසින් සේදිය හැකිය.

කෆන් කිරීම: (මිනිය අන්දවීම) මිනිය කෆන්කිරීම වාජිබ් වෙ. එය දෙපා සහ හිස ඇතුළුව මුළු දේහය වැසෙන සේ අන්දවන රෙදි කැබැලිවලින් සමන්විතය. රෙදිවලින් මිණිය

එතිය යුතුය. පිරිමි දේහය රෙදි කැලි තුනකින්ද, ස්ත්‍රිය කැලි පහකින්ද එතීම ප්‍රියමනාපය. (මේ ගැන උගතුන් ලවා සවිස්තරව දැන ගන්නට උත්සාහ කරන්න. (පරි)

මරණ නැමදුම :(සලාතුල් ජනාඉස්) මිනිය වෙනුවෙන් සුළු පිරිසක් හෝ නැමදීම වාජිබ් වේ. අනෙකුත් වාජිබ්වූ නැමදුම් සඳහාවූ සියලු නීතිරීති ජනාසා නැමදුම සඳහාද බල පැවැත්වේ.

මරණය වෙනුවෙන් නැමදුම් කරණ පිළිවෙළ:

මිනිය කිබ්ලා දෙසට හරහා තබා, ඉමාම් මිනියේ අසල සිට මරණ නැමදුම හසුරු විය යුතුය. අනෙක් අය පේලි තුනකට ඉමාම්ට පසුපසින් සිට නැමිදිය යුතුය. පිරිමි මරණයක් නම් ඉමාම් හිස අසලද, ස්ත්‍රියක් නම් ඉමාම් මැද හරියේ සිටද නැමදුම හසුරු විය යුතුය. නැමදුම පිණිස ඇත්තේ කෙනෙකු පමණක් නම් ඔහු පමණක් හෝ නැමදුම කළ යුතුය. නැමදුම වෙනුවෙන් අනෙක් සලාතයට කරන විලසින් තක්බීර් කළ යුතු අතර පළමු වන තක්බීර්හී සූරා ෆාතියා උසුරිය යුතුය. දෙවැනි තක්බීර්හී නබිතුමා කෙරෙහි (නැමදුමෙහි අත්තහිය්‍යාත් අවසානයේ පවසන) සලාතුල් ඉබ්රාහිමිය්‍යා පාරායනය කළ යුතුය. තුන්වන තක්බීර්හී මරණු අය වෙනුවෙන් පව් සමා සහ ප්‍රාර්ථනා කළ යුතුය. අවසාන තක්බීරයෙන් පසු දකුණු පසට හිස හරවා සලාම් දිය යුතුය. (සලාම් එකක් පමණක් සෑහේ. මරණ සලාතයේ අනෙක් සලාත් මෙන් රුකූඋ හෝ සුජූද් හෝ කරන්නේ නැත)



භූමදානය කිරීම: දේහය වැලලීම වාජිබ් වෙ. එය දේහය සම්පූර්ණව පස්වලට යට කිරීම වෙ. (ඒ සඳහා කබ්ර් නම් වලක් තිම විය යුතුය). මිනිය මිනිවලේ කිබ්ලාවට මුහුණ ලා දකුණු පැත්තට මදක් ඇලකර තැබිය යුතුය.

**වළලීමේදී පැළකිය යුතු සමහර කරුණු :**

1. සොහොන පොළොව මට්ටමෙන් සමාතලාව තිබිය යුතු බව මුහම්මද් නබි තුමා පැවසූහ. වියතක් පමණ මිනිවල උඩට මතුකර තැබීම බහුතර ඉස්ලාමීය විද්වතුන් ප්‍රියමනාප බව අදහස් කරති.
2. සොහොන මත හෝ වටා හෝ ස්මාරකයක් හෝ තාප්පයක් හෝ ඉදිකිරීම නබි තුමා තහනම් කළහ.
3. සොහොන මත දේවස්ථානක් ඉදි කිරීමද මුහම්මද් නබි තුමා තහනම් කළහ.
4. නුවුවනා ලෙස මිණිවලවල් නැවත හැරීම තහනමිය.
5. මිනිවල මත වාඩිවීමද තහනමිය.

## උපවාස ශීලය :

☆ කැම බීම සහ කායික සංසර්ගයෙන් (ස්වෝත්සාහයෙන් ධාතු පිට කිරීමෙන්ද) වැළකී ඉස්ලාමීය වසරේ රාමදාන් මාසයේ අනිවාර්යයෙන් හා අන්දිනවල සුන්නත් ලෙසද අළුයම ෆජ්ර් වෙලාවෙ සිට සැන්දෑ මග්රිබ් වෙලාව දක්වා කරනා වන්දනාමානය සවම් නම් උපවාස ශීලය වෙ. මෙය පරිනත පිරිමි සහ කාන්තා පක්ෂය කෙරෙහිම අනිවාය්‍ය වෙ. මන්දයත් උපවාස ශීලය අනිවාර්යය කටයුත්තකි.

සියළු මුස්ලිම්වරු කෙරෙහි උපවාසශීලය අනිවාර්යය කිරීම ගැන පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසයි:

﴿شَهْرُ رَمَضَانَ الَّذِيَ أُنزِلَ فِيهِ الْقُرْآنُ هُدًى لِّلنَّاسِ وَبَيِّنَاتٍ مِّنَ الْهُدَى وَالْفُرْقَانِ فَمَن شَهِدَ مِنكُمُ الشَّهْرَ فَلْيَصُمْهُ وَمَن كَانَ مَرِيضًا أَوْ عَلَى

سَفَرٍ فَعِدَّةٌ مِّنْ أَيَّامٍ أُخَرَ يُرِيدُ اللّهُ بِكُمُ الْيُسْرَ وَلاَ يُرِيدُ بِكُمُ الْعُسْرَ وَلِتُكْمِلُواْ الْعِدَّةَ وَلِتُكَبِّرُواْ اللّهَ عَلَى مَا هَدَاكُمْ وَلَعَلَّكُمْ تَشْكُرُونَ﴾

*රමදාන් මාසය කුමණාකාර වේ නම් මනුෂ්‍ය වර්ගයාට පරිසමාප්ත මගපෙන්වීම, නිවැරැදි මාර්ගය දක්වන පැහැදිලි ඉගැන්වීම්වලින් සමන්විත සත්‍යාසත්‍ය පහදා දෙන අල්කුර්ආනය පහළ වූවකි. ඒ මාසය ලබා ගත්තේ කවරෙක්ද ඔහු ඒ මාසයේ උපවාසයේ යෙදිය යුතුය. නමුදු ඒ මාසයේ යමෙකු ගමනේ යෙදී හෝ රෝගාතුරවී හෝ සිටී නම් වෙනත් දිනයක ඒවා සම්මාදම් විය යුතුය. අල්ලාහ් ඔබට සහනයක් ගෙන දීමට මිස අසීරු ඇති කිරීමට ප්‍රිය නොවන්නේය. උපවාස දින සම්පූර්ණ කරන්නද ඔබට යහමග පෙන්වූ හෙයින් අල්ලාහ්ගේ උත්තම භාවය ප්‍රශංසා කිරීමටද (අල්ලාහ්ට) ස්තූති වන්ත වීමද (අල්ලාහ්* *මෙම සහන ඔබට ලබාදී ඇත.* (සූරා අල්බකරා : 185)

වක්තෘ මුහම්මද් නබි (සල්) තුමා දෙසූහ: 'ඉස්ලාම්හී (වන්දනාමානයට අදාළ) කුළුණු පහකි. ඒවා වැඳිමට සුදුසු එකම දෙවියා අල්ලාහ් බවත් මුහම්මද් තුමා ඔහුගේ වක්තෘ වරයා ලෙසත් සාක්ෂි දැරීම, දෛනික නැමදුම අඛණ්ඩව ඉටුකිරීම, සකාත් බද්ද ගෙවීම, රමදාන් මාසයේ උපවාස ශීලයෙහි යෙදීම සහ ශක්තිය ලබන්නන් හජ් කර්තව්‍ය ඉටුකිරීම වේ'. (බුහාරි සහ මුස්ලිම්).

☆ මෙය නියම පරිණතවූ පිරිමි සහ කාන්තා දෙපක්ෂයටම අනිවාර්යය වේ. ස්ත්‍රිය මාසික සුධියෙන් සහ ප්‍රසව රුධිරයෙන් පිරිසිදු වී සිටිය යුතුය.

උපවාස ශීලය නිෂ්ප්‍රභා කරණ කරුණු :

1. කැම්බීම, කායික සංසර්ගයකින් ධාතු පිටවීම සහ සෙවෝත්සාහයෙන් පිට කිරීම (කෙනෙකු උපවාසයේ

යෙදී සිටි අවස්ථාවක නින්දේදී ධාතු පිටවී නම් උපවාසය නිෂ්ප්‍රභා නොවේ). (සණ දෙයක් හෝ අන් යමක් ශරීරයට ඇතුල් වීම). කාන්තාවන් උපවාසයෙහි යෙදී සිටින විට මාසික හෝ ප්‍රසවරුධිරය පිටවූවද උපවාසය නිෂ්ප්‍රභා වේ.

2. කෙනෙකු උපවාසය උවමනාවෙන් අත්හැරීමට හෝ අවසන් කිරීමට අධිෂ්ඨානය කළේනම් ඔහු පෙර සඳහන් උපවාසය නිෂ්ප්‍රභා වන යමක් නොකළද ඔහුගේ උපවාසය අවලංගු වේ.

3. යමෙකු අමතකවීමකින් උපවාසය නිෂ්ප්‍රභා වන යමක් කළේ නම් ඔහුගේ උපවාසය නිෂ්ප්‍රභා නොවේ.

4. යමෙකු සැතපුම් හතළිහකට වැඩි ප්‍රමාණයක ගමණේ යෙදෙන්නේ නම් හෝ උපවාසයේහි නිරතවිය නොහැකි අයුරු රෝගාතුවර සිටින්නේ නම් ඒ දවස්වල උපවාසය අත්හැර පසු දිනයක ඒවා පියවිය යුතුය. එසේම කිරි මවෙකු හෝ ගැබිණියෙකු තමා උපවාසයෙහි යෙදීමෙන් යම් අපහසුවකට පත්වේ යැයි බියවන්නේ නම් උපවාස යෙන් වැළකී වෙනත් දිනයක ඒවා පියවිය යුතුය.

5. උපවාසයෙහි යෙදීමට ශක්තියක් නොලද වයෝවෘද පිරිමින් සහ කාන්තාවන් උපවාසය අත් හැර ඒ සඳහා සැම දිනකම කෙනෙකුට සරිළන සුදුසු ආහාරයෙන් නියමිත ප්‍රමාණයක් දන් දිය යුතුය. (දන් දිය යුතු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් තුන්කාලකි)

## සකාද් බද්ද:

සකාත් බද්ද ඉස්ලාම්හී තුන්වන අනිවාර්යය වගකීමක් වේ. නැමදුම හා සම්බන්ධ කර අල්කුර්ආනයේ බොහෝ තැන්වල සකාත් ගැන සඳහන් වී ඇත.

සීමිත කාලය තුල කෙනෙකු වෙත තිබෙණ සේසතෙන් ආගම පවසන ප්‍රමාණයක් සකාත් ලෙස එය ලබා

ගැනීමට සුදුසු අය හට දීම අනිවාර්යය වේ. සකාත් බද්ද ගැන අල්කුර්ආනය මෙසේ පවසයි:

﴿خُذْ مِنْ أَمْوَالِهِمْ صَدَقَةً تُطَهِّرُهُمْ وَتُزَكِّيهِم بِهَا﴾

(නබි තුමනි,) ඔවුන්ගේ සේසතෙන් දන් වෙනුවෙන් වූ කොටස රැගෙන ඔවුන් පිරිසිදු කර ඔවුන්ගේ සිත්ද පවිත්‍ර කරනු මැනවි. (සූරා අත්තව්බා 103)

නබි තුමා දෙසූහ: 'ඉස්ලාම්හී මූලික යුතුකම් පහකි. ඒවා වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කෙනෙකු නැත, තවද මුහම්මද් තුමා අල්ලාහ්ගේ වක්තෘ වරයාවේ යනුවෙන් සාක්ෂි දැරීමද, නැමදුමෙහි අඛණ්ඩව නිරත වීම, සකාත් නම් දුගී බද්ද ගෙවීම, රමසාන් මාසයේ උපවාසයෙහි යෙදීම සහ හජ් කර්තව්‍යය ඉටුකිරීම වේ.(ග්‍රන්ථ : බුහාරි සහ මුස්ලිම්)

* සකාත් බද්ද ගෙවීම කෙනෙකු ප්‍රිය වී කරන උදව්වක් නොව, එය අනිවාර්යය කටයුත්තකි. සකාත් දීමෙන් එය ඉටුකරන්නාට කිසිදු ලෞකික ප්‍රසිද්ධත්වයක් නොලැබේ. මෙය ආර්ථික හා සම්බන්ධ යුතුකමක්ද, දෙවිඳු විසින් නියමවූ වන්දනාමානයක්ද වේ. දුගීන්ගේ ජීවන තත්ත්වය ඉහළ මට්ටමකට පත්වනු වස් අල්ලාහ් මෙය අනිවාර්යය කර ඇත. සකාතය අප මුහුණ දෙන දුක් කරදරවලට පිළියමක් ලෙසද, සැදැහැවතුන් අතර ඉවසීම සහ පරාර්ථකාමීත්වයක් හා සිත්සතන් තුල සහනයක් ඇති කරනා අඩිතාලමක් ලෙසද වේ.

<u>සකාත් ගෙවිය යුතු දේ සිව් වැදෑරුම් වේ.</u>

1. පොළොවෙන් ලබාගන්නා දේ. (ධාන්‍ය වර්ග, අනෙක් කෘෂිකාර්මික ඵලදාවන් සහ ඛණිජ වර්ග) නමුදු ඵලතුරු හා එළවළු වර්ගවලට සකාත් නියම නොවේ.

2. පශු වර්ගයේ සත්තු (හරක්, එළුවන් සහ ඔටුවන්)

3. රන් සහ රිදී. රන්රිදී හැර (මුතුමැණික් වැනි) අන් වටිනා භාණ්ඩවලට සකාත් බද්ද නියම වන්නේ නැත.

4. සියළු වෙළඳ ද්‍රව්‍යයන්. තම නිවස සහ නිවසෙහි පාවිච්චි කරන අත්‍යාවශ්‍ය බුමුතුරුණු, ගෘහභාණ්ඩ, යානවාහන සහ අනෙකුත් ආම්පන්නයන් හට සකාත් බද්දක් නැත.

**සකාත් නියමවීමට විය යුතු ප්‍රමාණය:**

සකාද් ගෙවිය යුතු දැයට දහම පවසන නියම ප්‍රමාණය සහ නියම කාලය නොවන්නට ඒවාට සකාත් බද්දක් නියම නොවේ. ද්‍රව්‍යයන් අනුව සකාත් නියමවියයුතු ප්‍රමාණයද වෙනස් වේ. සකාත් ගෙවිය යුතු ආකාරය කෙටියෙන් මතු සඳහන්වේ:

### මහපොළොවෙන් ලැබෙන දේ

| වර්ගය | ප්‍රමාණය | ගෙවන ප්‍රමාණය |
|---|---|---|
| ධාන්‍ය, වියළි මිදි සහ රටඉඳි වැනි දේ | උවසාක් 5ක් හෝ එයට වැඩි.(සාඋ 60 අවසාක් එකකි. සාඋ එකක් දෝත පුරා වූ අහුරු 4කි) | ස්වභාවික ජලයෙන් (අමතර වියදමකින් තොර) ලබන අස්වැන්න සඳහා 10 . වියදම් කර ලබන දැ සඳහා 5 |
| ඛනිජ වර්ග | රන්රිදී හා සමාණ | 2.5 |

### ඔටුවන් හරකුන් සහ එළුවන්

| වර්ගය | ප්‍රමාණය | ගෙවන ප්‍රමාණය |
|---|---|---|
| ඔටුවන් | 5-9 | එළුවෙක් |
| ඔටුවන් | 10-14 | එළුවන් 2 යි |
| ඔටුවන් | 15-19 | එළුවන් 3 යි |
| ඔටුවන් | 20-24 | එළුවන් 4 යි |

| | | |
|---|---|---|
| හරකුන් | 30-39 | වසරක පැටවෙක් |
| හරකුන් | 40-59 | දෙවසරක පැටවෙක් |
| හරකුන් | 60-69 | වසරක දෙන්නෙක් |
| හරකුන් | 70-79 | වසරක එකක් සහ දෙවසරක එකක් |
| එළුවන් | 40-120 | එළුවෙක් |
| එළුවන් | 121-200 | පදන්නෙක් |
| එළුවන් | 201-299 | තුන් දෙනෙක් |

## රන්රිදී සහ මුදල්

| ද්‍රව්‍ය | තිබිය යුතු ප්‍රමාණය | ගෙවීම |
|---|---|---|
| රන් | ග්‍රෑම් 85 හෝ වැඩි | 2.5 |
| රිදී | ග්‍රෑම් 595 හෝ වැඩි | 2.5 |
| මුදල් | රන් රිදී හා සමාණ | 2.5 |

## වෙළඳ ද්‍රව්‍ය

| වෙළඳ ද්‍රව්‍ය | ප්‍රමාණය | ගෙවීම |
|---|---|---|
| වෙළඳ භාණ්ඩ | රන්රිදී හා සමාණ ප්‍රමාණ | 2.5 |

* පෙර සඳහන්වූ දේවලින්මතු සඳහන් දේ හැරෙන්නට අවුරුද්දක් නොපිරෙන්න සකාද් අනිවාර්යය නොවේ.

1. ධාන්‍ය සහ කෘෂිකාර්මික එලදාවන්: ඒවා පැහී භාවිතයට සුදුසු අවස්ථාවට පත්වූ විගස.

2. වෙළඳ ද්‍රව්‍යයන්හී ලාභ : මූලික ධනය හා ලාභයද ගණන් බලා දිය යුතුය. ලාභයට අවුරුද්දක් සම්පූර්ණ විය යුතුය යනුවෙන් නියමයක් නැත.

3. (ඔටුවන්, එළුවන්, හරකුන්) පශු වර්ගයේ සතුන්ගේ පැටවුන්. පැටවුන්ට සතුන් හා ගණන් කර දිය යුතුය. පැටවුන්ට වසරක් සම්පූර්ණ විය යුතුයැයි නියමයක් නැත.

* සකාත් ලැබීමට සුදුසු පන්ති අටකින් සමන්විතය.

1. දිළිඳු අසරණයන්. 2. දුගියන්.

3. සකාත් බද්ද රැස් කරන්නන්.

4. සිත් ආකර්ෂණය වූවන්, (ඉස්ලාමය කෙරෙහි මනාප වී අසරණ වී සිටින නවකයන්ගේ සිත්සතන් ආකර්ෂණය වනු වස් මවුන්ටද, ඉස්ලාම් නොවූ නමුත් ඉස්ලාම් කෙරෙහි ප්‍රියමනාප ඇති කරනුවස් හෝ මවුන් උවදුරු වලින් මිදීම පිණිස හෝ සකාත් ගෙවීම)

5. නිදහස් වීමට අපේක්ෂා කරන වහලුන්.

6. ණය තුරස්වලින් මිරිකුනු ණය කරුවන්.

7. අල්ලාහ්ගේ මාවතෙහි පීහාද් කරන්නන්.

8. ධනවතුන් වූවද ගමනේ යම් අකරතැබ්බකට මුහුණ පා කරදරයට පත්වූ මගීන්.

* සකාත් අල්ෆිත්ර්: උපවාසය අවසාන දිනයේ පස්වරුවේ රැද් දිනය පටන් ගත් අවස්ථාවේ සිට රැද් නැමදුම කරන තුරු තමා සාමාණයෙන් භාවිතා කරන ආහාර වර්ගයෙන් 'සාඋ' ප්‍රමාණයක් දීම සෑම පිරිමි සහ ස්ත්‍රී දෙපාර්ශවයේ අයටම අනිවාර්ය වේ. (සාඋ යනු කිලෝ තුනක් හා සමාණ ප්‍රමාණයකි) තම ගමේ පදිංචි දිළිඳුන්ට දුගීන්ට මෙය බෙදා දිය යුතුය. තම උපවාසය පවිත්‍ර කිරීම සහ අවුරුදු දා දුගීන්ගේ උවමනාව සපුරාලීම මෙයින් අපේක්ෂා කෙරේ.

* සතුන් කැපීම (මාංශදානය):

සතුන් කැපීමේදී මුලුමණින්ම පන සහ ලේ පිටවන සේ සතාගේ උගුරදණ්ඩ අසල ගලනාලය හා ප්‍රශ්වාස නාලය කැපිය යුතුය. කපන කළ බිස්මිල්ලාහ් යයි අල්ලාහ්ගේ නම සඳහන් කළ යුතුය. එසේ අල්ලාහ්ගේ නම සඳහන් නොකර කපන, ඉස්ලාම් අනුභවයට අනුමත කර ඇති කිසිම සතෙකුගේ මාංශ අනුභව කිරීම තහනම් වේ. මාලුවා සහ පතාංගයා මැරුණට පසුද කෑමට හැකිය.

﴿وَلَا تَأْكُلُوا مِمَّا لَمْ يُذْكَرِ اسْمُ اللَّهِ عَلَيْهِ وَإِنَّهُ لَفِسْقٌ﴾

*අල්ලාහ්ගේ නම සිහි නොකර මැරූ කිසිවක් අනුභව නො කරව. සැබැවින්ම එය මහා පවකි.* (සූරා අන්ආම් : 121)

වක්තෘ මුහම්මද් තුමා මෙසේ දෙසූහ : 'අල්ලාහ්ගේ නම සිහිකරමින් (නිසිලෙස ඝාතනය කර) ලේ හැලූ දේ අනුභව කරන්න.'

**හජ් කර්තව්‍යය** :

පරිනතවූ සෑම මුස්ලිම් පිරිමි සහ කාන්තාවන් කෙරෙහි හජ් කටයුත්ත එක්වරක් පමණක් අනිවාර්යය වේ. අවශ්‍ය මුදල්, ශරීර සෞඛ්‍ය සහ ගමන් කිරීම පිණිස බියෙන් තොර අවස්ථාවන් ඒ සඳහා විය යුතුය.

﴿ وَلِلَّهِ عَلَى النَّاسِ حِجُّ الْبَيْتِ مَنِ اسْتَطَاعَ إِلَيْهِ سَبِيلاً ﴾

*'තවද ඒ සඳහා වූ මාවතෙහි ගමන් කිරීමට ශක්තිය ලද්දන් ඒ (මස්ජිදුල් හරම් නම්) නිවෙස වෙත ගොස් හජ් කිරීම අනිවාර්යය වේ.* (සූරා ආල-ඉම්රාන් 97)

වක්තෘ මුහම්මද් නබි තුමා දෙසූහ: 'ඉස්ලාම්හී වැඳුම් පිදුම් පිණිසවූ) කුළුණු පහකි. ඒවා: වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැත බවත් මුහම්මද් තුමා අල්ලාහ්ගේ අවසාන වක්තෘ වරයා බවත් සාක්ෂි දැරීම, දෛනික නැමදුම ඉටුකිරීම, සකාද් ගෙවීම, රාමසාන් මාසයේ උපවාසය සහ ශක්තිය ලබන්නා හජ් කර්තව්‍ය ඉටු කිරීම වේ'. (ග්‍රන්ථය : බුහාරි සහ මුස්ලිම්)

<u>හජ්හී අනිවාර්යය කටයුතු හතරකි.</u>

ඉහ්රාම්, තවාෆ්, සඊ සහ නියමිත දිනයේ අරෆාහී රැඳීම යන සිව්වැදෑරුම් කරුණු වේ. යමෙකු මේවායෙන් එකක් හෝ පැහැර හරින්නේ නම් ඔහුගේ හජ් නිෂ්ප්‍රභා වේ.

**ඉහ්රාම්**: හජ් පිණිස නියමිත අවස්ථාවේ නියමිත ස්ථානයේ ඒ ස්ථානය පසුවන්නට පෙර 'අල්ලාහුම්ම ලෙබ්බෙයික්ක

හජ්ජත්' යනුවෙන් පවසා (නිය්යත්) චේතනාව කරගනිමින් හජ් කටයුත්ත පටන් ගැන්මේ මුල්ම පියවර වේ.

ඉහ්රාම් කිරීමට පෙර තම මසන ලද ඇඳුම් ඉවත්කර සුදු රෙදි කැලි දෙකක් භාවිතා කළ යුතුය. කාන්තාවන් තම රූපශ්‍රියාව පිටට නොපෙනෙන අයුරු විවිධ විලාසිතා වෙන් හෙබි වෛවාර්ණික නොවූ තමන් පොදුවේ අඳින චාම් ඇඳුමකින් සැරසිය යුතුය.

**තවාෆ් :**

* දුල් හජ් මාසයේ දසවැනි දිනය හෝ 11, 12, 13 වැනි දින ඇතුලත එක් දිනක් කඃබාව සත් වරක් තවාෆ් නම් ප්‍රදක්ෂිණා කිරීම වේ.

* තවාෆ් වෙනුවෙන් විශාල සහ සුළු කිල්ලෙන් පිරිසිදු වී සිටිය යුතුය.

* තවාෆ් කිරීමේදී එක් වටයක් හෝ දෙකක් ගොස් මද ගිමන් හැරීමකින් අනෙක් ඒවා නොගොස් අඛණ්ඩව ප්‍රදක්ෂිණාව අවසන් කළ යුතුය.

* හජ්රුල් අස්වද් සිට වම්පැත්තෙන් තවාෆ් පටන් ගත යුතුය.

* නැමදුමට මෙන් ශරීරයේ අනිවාර්යයෙන් වැසිය යුතු අවයවයන් වැසිය යුතුය.

**සඊ කිරීම:**

* හජ් කර්තව්‍ය වෙනුවෙන් සෆා සහ මර්වා අතර සත් වරක් ගමන් කිරීම වේ.

* සෆාවෙන් පටන්ගෙන මර්වාවෙන් අවසන් කළ යුතුය. සෆා සිට වරක් යැම එක්වරක් ලෙසත් මර්වා සිට සෆා වෙත යැම තවත් වරක් ලෙසත් ගණන් ගැනේ. එසේ සත් වරක් අවසන් කළ යුතුය.

**අරෆාහ් රැඳීම :**

* නිය්යත් හා අරෆාහ් සීමාව තුළට පිවිසී සිටිය යුතුය.

* අරෆාහ් වේලාව, නවවන දින දුහර් නැමදුම සිට දහවන දින ෆජ්ර් දක්වා වේ. නව වැනි දින මධ්‍යහනේ සිට ඉර බසින තුරු අරෆාහ් රැඳිය යුතුය. අඩුම වශයෙන් ඒ කාලය තුල සුළු වේලාවක් හෝ අරෆාහ් සීමාව තුල රැඳී සිටීම අතිවැදගත් (ෆර්ළ්) වේ.

උම්රා : උම්රා කර්තව්‍ය ඕනෑම දිනයේ ඕනෑම අවස්ථාවක කළ හැකිය. මීකාත්හී අවශ්‍ය ඇඳුමෙන් ඉහ්රාම් කර සැරසී තවාෆ් සහ සඊ කර හිස කෙස් බූ ගෑම හෝ කෙටි කිරීම වේ. කාන්තාවන් තම කෙස් වැටියෙන් සුළු කොටසක් කෙටි කළ යුතුය.

හජ් තමත්තුඋ :

1. හජ් හා සම්බන්ධ මාසවල මීකාත්හී ඉහ්රාම් කර 'ලෙබ්බෙක්ක අල්ලාහුම්ම උම්රතන් මුතමත්තිඅන් බිහා ඉලල් හජ්' යනුවෙන් නිය්යත් පැවසිය යුතුය.(තමත්තුඋ වෙනුවෙන් වූ මාසයන් ෂව්වාල්, දුල්කඃදා සහ දුල්හජ් මාසයේ මුල දින දහය දක්වා වේ)

2. පසුව හරම් වෙත ගොස් කඃබාව වටා සත් වරක් ප්‍රදක්ෂිණා කළ යුතුය.

3. පසුව සෆා මර්වා අතර සඊ කළ යුතුය.

4. පසුව ඉහ්රාම් වෙතින් නිදහස්වීම පිණිස හිස් කෙස් කෙටි කළ යුතුය. පසුව තමාගේ පුරුදු ඇඳුම්වලින් සැරසිය හැකිය. ඉහ්රාම් කළ කෙනෙකු නොකළ යුතු සියලු දේවලින් දැන් ඔහු නිදහස්ය.

5. දුල් හජ් මාසයේ අට වන දින හජ් වෙනුවෙන් තමා පසුවන ස්ථානයේ සිට ඉහ්රාම් කළ යුතුය. (අල්ලාහුම්ම ලෙබ්බෙක්ක හජ්ජන් යනුවෙන් නිය්යත් වචනවලින් පැවසිය යුතුය) නවවන දින ඉර උදාවූවායින් පසු අරෆා බලා පිටත් විය යුතුය.

6. නවවන දින ඉර බැස යනවාත් සමග අරෆා සිට මුස්දලිෆා වෙත යා යුතුය.

7. එහි රැඳී ෆජ්ර් නැමදුම අවසන් කර ඉර උදාවූවායින් පසු මිනා බලා පිටත් විය යුතුය.

8. මිනා පැමිණ වහා මහ ජම්රාතයට ගොස් ගල් හතක් ගැසිය යුතුය.

9. පසුව හිසකෙස් බුගාගත යුතුය. ස්ත්‍රීන් හිස කෙස් තැනින් තැන ටිකක් කපා ගත යුතුය. ඒ හා ඉහ්රාම යෙන් ගැලවී තම පුරුදු ඇඳුමන් ඇඳ ගත හැකිය.

10. පසුව සතුන් බිලි (මාංශදානය) දිය යුතුය. එය 13 වන දින අයියාමුල් තෂ්රීක් දින දක්වා කළ හැකිය.

11. පසුව හජ් වෙනුවෙන්වූ තවාෆ් සහ සඊ කළ යුතුය.

12. අය්යාමුල තෂ්රීක් දිනයන්හී මිනාහී රෑ රැඳිය යුතුය.

13. ඒ දවස්වල ඉර මුදුණ්වූ දිවාල් අවස්ථාවෙන් පසු ජම්රාත්හී තුන් ස්ථානයටම කුඩා ජම්රාත් සිට පිළිවෙළින් ගල් හතක් ගැසිය යුතුය.

14. අවසාන වශයෙන් මක්කාවෙන් පිටවන්නට පෙර සමුගැනීමේ තවාෆ් (තවාෆ් අල් විදා) කළ යුතුය.

හජ්හී වාජිබ් :

1. දිවා කාලයේ පැමිණියා නම් ඉර බසින තුරු අරෆාහී රැඳිය යුතුය. අරෆාවට ප්‍රමාද වී රාත්‍රියේ පැමිණියද එහි සුළු වේලාවක් හෝ රැඳී සිටිය යුතුය.

2. නියමිත මීකාත්හී ඉහ්රාම් කිරීම. කවරෙකු හෝ මීකාතය පසුකර ඉහ්රාම් කළේ නම් ඔහු වාජිබයක් අත්හල කෙනෙකු ලෙස වේ.

3. අරෆා සිට පිටවී පැමිණ මුස්දලිෆාහී රෑ ගත කිරීම.

4. දුල් හජ් දහවනදා ජම්රාතුල් අකබාහී ගල් ගැසීම. අයයාමුල් තෂ්රීක් දිනයන්හී ඉර මුදුනෙන් ඉවත්වූ පසු ජම්රාත්හී තුන් පලටම ගල් ගැසීම.

5. හිසකෙස් බුගැම හෝ කෙටි කිරීම. දහවන දින ජම්රතුල් අකබාහී ගල්ගැසීමෙන් පසු එය සිදුකළ යුතුය.

6. තෂ්රීක් දිනවල මිනාහී රෑ ගතකිරීම. (එනම් 11, 12, 13 දිනයන්වෙ. අවශ්‍ය නම් 12 දා ගල් ගැසීමෙන් අනතුරු මිනා සිට පිටත් විය හැකිය.

7. සමුගැනීමේ තවාෆ්.(තවාෆ් අල් විදා)

සටහන: හජ්හී වාජිබ්වලින් යමක් හෝ කඩ කළා නම් ඒ වෙනුවෙන් එළුවෙකු බිලි දිය යුතුය. ඒවායේ මාංශ මක්කා හරම්හී දුප්පතුන් අතර බෙදා දිය යුතුය.

ඉහ්රාම් කළ කෙනෙකු නොකළ යුතු දේ :

1. පිරිමින් තම පුරුදු ඇඳුම් ඇදීම.

2. හිස ආවරණය කිරීම (පිරිමින්).3. සුවඳ විලවුන් තැවරීම.

4. හිස කෙස්වලින් හෝ කයෙන් දැනුවත්ව යමක් ඉවත් කිරීම. 5. නියපොතු ඉවත් කිරීම. 6. දඩයම් කිරීම. 7. නිමවිය යුතු ක්‍රියාවන් සියල්ල නිම වන්නට පෙර කායික තෘප්තීන් සම්බන්ධ කාර්යයන්හී යෙදීම.

8. විවාහ පොරොන්දුන් සිදුකිරීම හෝ ඒ වෙනුවෙන් කතා පවත් වීම. 9. කායික සංසර්ගය.

සටහන : කාන්තාව මුහුණ වැස්ම හෝ අත් මේස් හෝ නොපැළඳිය යුතුය.

ගනුදෙනු

ආගම අනුමත නොකළ සමහර වැදගත් ගනුදෙනු මෙසේය :

1. මුස්ලිම් වරයෙකු යමක් කෙනෙකුගෙන් මිලදී ගැනීමෙන් පසු එය මහුගෙන් අත්පත් කර ගැනීමට පෙර එය වෙනත් කෙනෙකුට විකිණීම තහනම්ය.

2. අයෙක් යමක් මිලදී ගත් පසු, එවා ආපසු භාරවා දෙන ලෙසත්, එය තමා එයට වඩා අඩු මුදලට මහුට විකුණන බවත් කීම නුසුදුසුය. වෙළෙඳෙකු විසින් යමක් කෙනෙකුට විකුණා අවසන් වූවාට පසු තමා මහු දුන් මුදලට වඩා මුදලක් ගෙවන බව එම වෙළෙඳාට පොරොන්දු වෙමින් විකුණු දේ ආපසු භාරවා ගන්නා ලෙස කීම වැරදි සහිතයි.

3. ආගමෙන් තහනම් කළ දේ හෝ අපිරිසිදු දේ විකිණීම තහනම්ය. ඒවා විකිණීම පිණිස උදව් උපකාර වීම සහ කුලියට දීම වැනි ඒ වෙනුවෙන් සිදුකරන සියලු පිටිවහල් තහනම් වෙ. මත්ද්‍රව්‍ය, උරු මස්, අනෙකුත් මත් ද්‍රව්‍ය සහ ආගමික විසින් තහනම් කරන ලද මත්පැන් නිෂ්පාදනය කරන්නාට මිදි යනාදීන් විකිණීමද තහනම් වෙ.

4. තම මුස්ලිම් සහෝදරයා අතපසුවට පත්කරනසුළු සියලු රවටා විකිණීම තහනම් වෙ. ජලයේ පසුවන මත්ස්‍යයා, අහසේ පියාඹන පක්ෂියා, කුසේ සිටින පැටවා සහ සතෙකුගේ මඩියේ ඇති කිරි වැනි දේද විකිණීම තහනම්ය.

5. තමා සතු නොවූ දෙයක් හෝ තමා වෙතට පත්වන්නට පෙර හෝ යමක් විකිණීම තහනම් වෙ. එසේ කිරීමෙන් බොහෝ කරදර සහ අවනඩු ඇති විය හැකිය.

6. ණයට ගත් දෙයක් (නැවත) ණයට විකිණීම තහනම්ය. (කෙනෙකුගේ එළුවෙකු සීමිත කාලයක් සඳහා ණයට ගත් පුද්ගලයා ඒකී කාලය තුල ඒ ණය පියවීමට නොහැකිවී 'එය මට රියාල් 300කට විකුණන්න සීමිත කාලයකට පසු ඒ මුදල මා ගෙවන්නම්' යනුවෙන් කීමකි. මෙය ණයක් ණයට විකිණීමක් ලෙස ගණනව වන හෙයින් තහනම්ය.)

7. මුස්ලිම්වරයෙකු යමක් කෙනෙකුට සීමිත කාලයකට (ණයට) විකුණා පසුව නැවත එය විකුණුම් කරු ඔහු ගෙන් අත්මුදලට අඩු මුදලකට මිලදී ගැනීම තහනම්ය.

8. වංචා සහගත සියලු වෙළඳාම් තහනම් වෙ.

9. පොලි ගැනීම තහනම්ය. බැංකුවලින් ලැබෙන ආධායම පොලියකි. එසේම මෙවන් බැංකුලව කොටස් කරුවන් වීම සහ ආයෝජන කිරීමද තහනම් වෙ.

10. යානවාහන හෝ වෙළඳ සැල් හෝ ජීවිත රක්‍ෂණද වැනි සියලු මාර්ගයේ රක්‍ෂණ හරාම් වෙ.

11. ජුම්ආ සලාතය සඳහා අවසන් ඇමතුම කිරීමෙන් පසු වෙළඳාම් වැනි දේවලින් වැළකී සිටිය යුතුය.

12. යම් මුදලක් වෙනත් (රටක) මුදලකට මාරුකිරීමේදී ඒ වෙනුවෙන්ඒ ස්ථානයේම අත්පිටු මුදලට අත්පත් කරගත යුතුය. දෙපාර්ශවයම එකම ස්ථානයක විවෘතව මෙම කටයුත්ත එසේ අත්පත් කරගැනීමට පෙර දෙදෙනාම වෙන්වුයේ නම් ඒ හුවමාරුව අවලංගු වෙ.

**විවාහය:**

යමෙකු වියහියදම් කිරීමට ශක්තියක් තිබී (දුරාචාර වැනි) තහනම් මාර්ගයේ යෙදෙනු ඇතැයි බිය වන්නේ නම් ඔහු විවාහ වීම වාජිබ් (අනිවාර්යය) වෙ. එසේ නොවන්නට විවාහය මුස්තහබ් හෙවත් ප්‍රියමනාප දෙයකි. එසේම විවාහය අල්ලාහ් දෙවිදුගේ වක්තෘවරුන්ගේ පිළිවතෙකි.

නිකාහ් (විවාහයක්) පිළිගැනීම පිණිස අනිවාර්යය කරුණු හතරක් සම්පූර්ණ විය යුතුය:

1. වලී : මනමාලියගේ පාර්ශවයෙන් ඇගේ පියා හෝ ඇයට පියාගේ පාර්ශවයෙන් ඉතා කිට්ටු නෑකමෙන් යුත් නුවන් වැදගත් පිරිමි භාරකරුවෙක්.

2. සාක්ෂි: විවාහ ගිවිසුම ප්‍රකාශ කිරීමේදී විශ්වාස වන්ත මුස්ලිම්වරුන්ගෙන් දෙන්නෙකු හෝ එයට වැඩි පිරිසක් හෝ සහභාගි විය යුතුය.

3. ගිවිසුම් ප්‍රකාශය : මෙය විවාහ බන්ධනය ඇති කරනු වස් මනාලයා සහ මනාලියගේ වලී (භාරකරු) අතර සිදු කරන ගිවිසුම් ප්‍රකාශනයකි. එයට පැවරීම සහ එකඟවීම අර්ථය සඳහන් වූවද ඒ සඳහා මිනිසුන් අතර භාවිත වන භාෂාමය වැකිය භාවිතා කළ හැකිය. එනම් මනාලියගේ වලිවරයා 'මගේභාරයේ සිටින මෙම ස්ත්‍රිය ඔබට විවාහ කර දුන්නෙමි' යනුවෙන් පවසන අතර මනාලයා 'ඇගේ විවාහ මම පිළිගත්තෙමි' යනුවෙන්ද එකඟ වී ප්‍රසිද්ධියේ වචනයෙන් ප්‍රකාශ කිරීම වේ.

4. මහර්: විවාහ වීමේදී මනමාලයා විසින් මනමාලිය වෙත පිරිනමන විවාහ දීමනාව වේ. ඒ දීමනාව හැකි ඉක්මණින් ගෙවා නිම කිරීම මනාලයාගේ යුතුකමකි.

﴿وَآتُوا النِّسَاءَ صَدُقَاتِهِنَّ نِحْلَةً﴾

*ඔබ (විවාහ වූ) ස්ත්‍රීන්ට ඔවුන්ගේ මහර් (විවාහ දීමනාව) සතුටෙන් පිරිනමව.* (සූරා නිසාඋ : 4)

මනාලයා විසින් මනාලියට පිරිනමන විවාහ දීමනාව එනම් මහර් තොගය මනාලියගේ දයාදයකි. ඇගේ කැමැත්ත නොවන්නට එහි යමක් සතු කර ගැනීම අන් කිසිවෙකුට කිසිදු අයිතියක් නැත.

* ස්ත්‍රියෙකු තමා අකමැති කෙනෙකු හා විවාහ වීමට බලකිරීම නුසුදුසුය. විවාහයක් පිණිස ඇගේ කැමැත්ත ඉතා වැදගත් වේ.

* කෙනෙකුට යෝජනා කළ මනාලියෙකු ඇගේ පෙර යෝජනාව ප්‍රතික්ෂේප වන්නට පෙර වෙනත් කෙනෙකු ඇයට යෝජනාවක් ඉදිරිපත් කිරීම නුසුදුසුය.
* විවාහයට තීරණය වූ ස්ත්‍රියක් හා විවාහය නියම ආකාරයෙන් නිමාවන්නට පෙර ඇය හා තනිව සිටීමද, ප්‍රසිද්ධියේ පිටවී යෑමද නුසුදුසු වේ.
* ස්වාමිපුරුෂයා වියොවෙන් පසුව තනි රකින ඉද්දා කාලය අවසන් වන්නට පෙර හෝ දික්කසාදවීමෙන් පසු ඉද්දා අවසන් වන්නට පෙර ඇය වෙනුවෙන් නව විවාහයක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් සම්මුතියක් ඇති කරගැනීම තහනම්ය.
* ස්වාමියා මලේ නම් ස්ත්‍රිය සිව් මසක් සහ දින දහයක් ඉද්දා (නම් තනි රැකීමේ) කාලය වේ.
* ඇය ස්වාමියාගෙන් දික්කසාද වී නම් ඒ වෙනුවෙන් ඉද්දා කාලය ඔසප් තුනකි. ඔසපය නැවැතුනු ස්ත්‍රියගේ ඉද්දා කාලය මාස තුනකි.
* පිරිමියෙකුට එක්වර කාන්තාවන් සිවදෙනෙකුට වැඩිය විවාහ කරගැනීම තහනම් වේ.
* තම බිරිඳට සහ ළමයින්ට ජීවත්වීමට උවමනා දේ සැපයීම ස්වාමියා කෙරෙහි වාජිබ් වේ.
* මුස්ලිම් කාන්තාවක් කිසිම අවස්ථාවක මුස්ලිම් නොවන කෙනෙකු හා විවාහ වීමට නොහැකිය.
* මුස්ලිම් පිරිමියෙකු යුදෙව්වෙකු හෝ ක්‍රිස්තියානි කාන්තාවක් විවාහ කර ගත හැකිය. නමුදු මුස්ලිම් කාන්තාවක්ම තෝරාගැනීම වඩා හොඳය.

තලාක් : දික්කසාදය

* දික්කසාද කිරීම ස්වාමියාට අයත්වේ. යම්යම් ප්‍රශ්ණ මතුවී තම බිරිඳ හා වැඩි දුරටත් විවාහ ජීවිතයේ

සාමයෙන් තියලී සිටීමට නොහැකි බව හැඟී යන්නේ නම් 'මම ඔබ තලාක් කරමි' (මම ඔබ දික්කසාද කරමි) යනුවෙන් නිත්‍යානුකූලව පවසා වෙන්වීම වේ.

* මතුවටත් ධම්පතීන්ට සන්සුනෙන් ජීවත්විය නොහැකි තත්ත්වයක් උදාවී නම් ස්වාමියාට ඔහුගේ බිරිඳ කෙරෙහි තලාක් කීම සඳහා එනම් විවාහ බන්ධනයෙන් ඉවත් වීමට පියවර තුනක් වේ. වරෙක 'තලාක්' පවසා වෙන්වී නැවත දෙපාර්ශවයේ සාමුහික එකඟ වීමකින් ඇය ආපසු කැඳවා ගත්තේ නම්, දෙවැනි සහ තෙවැනි වාරයන්හී ඇය තලාක් කිරීමට ඔහුට හැකිය. තුන්වැනි වතාවටද ඔහු ඇය තලාක් කිරීමෙන් පසු ඇය නැවත වරක් කැඳවා ගැනීමට නම්, ඇය තවත් කෙනෙකු විවාහ වී ඇය හා කායික සංසර්ගයේ යෙදීමෙන් පසු ඔහුද තලාක් කර ඉද්දා කාලය අවසන් වූවාට පසුව හැරෙන්නට පෙර සැමියාට නැවත වරක් ඇය කැඳවා ගැනීමට කිසිසේත් නොහැකිය.

* වැඩි දුරටත් තම ස්වාමියා හා පවුල් ජීවිතයක් ගත කිරීමට නොහැකි බව බිරිඳට හැඟී යන්නේ නම් ඔහු වෙතින් නිත්‍යයානුකුගව වෙන්වීම පිණිස කුලාඋ නම් වෙන්වීම ඉල්ලා සිටිමට බිරිඳටද අයිතියක් තිබේ.

1. ස්ත්‍රීන්ගෙන් විවාහ වීමට තහනම් අය නැකමෙන් සත් වැදෑරුම් වේ.
මව, සහෝදරිය, දුව, සහෝදරියගේ දුව, සහෝදරයාගේ දුව, නැන්දා සහ මවගේ සහෝදරිය.

2. කිරි පෙවීමෙන් විවාහ වීම කෙරෙහි තහනම් වන අය සත් කොටසකි:

කිරි පෙවීමෙන් වූ මව, කිරි පෙවූ මවගේ දුවරුන්, කිරි පෙවූ මවගේ දුවගේ දුවරුන්, කිරි පෙවූ මවගේ පුතාගේ

දුවරුන්, තම බිරිඳ විසින් කිරි පොවන ලද ළදුන්, කිරිමවගේ ස්වාමියාගේ සහෝදරියන් සහ කිරි මවගේ එක් කුස උපන් සහෝදරියන්.

**3. විවාහයෙන් පසු තහනම් වන අය :**

මවුන් කොටස් හතරකි.

අ. කායිකව එක්වුනු බිරිඳගේ දුව, ඇගේ පුතාගේ දුව සහ ඇගේ දුවගේ දුව වැන්නන්.

ආ. පියාගේ වෙනත් කසාදයෙන් වූ බිරිඳ.

ඉ. පුතාගේ බිරිඳ, පුතාගේ පුතාගේ බිරිඳ, දුවගේ පුතාගේ බිරිඳ සහ ඒ පරාම්පරා ගත අය.

ර්. බිරිඳගේ මව, ඇගේ මවගේ මව, බිරිඳගේ පියාගේ මව සහ ඒ පරම්පරාවේ අය.

* සම කාලය තුල තම බිරිඳගේ සහෝදරියන්, ඇගේ නැන්දන් සහ ඇගේ මවගේ සහෝදරියන්.

* නිත්‍යානුකූලව දික්කසාද නොවී වෙනත් පිරිමියෙකුගේ විවාහ බන්ධනයේ පසුවන බිරිඳන්.

අන්නපාන :

* ආගම විසින් තහනම් කළ දේ හැරෙන්නට අන් සියලු ආහාර පාන භාවිතය පිණිස අනුමතවේ. ආගම අනුමත නොකළ දේ මෙසේ වර්ග කළ හැකිය.

1. සියලු වර්ගයේ මත් ද්‍රව්‍යයන්.

2. අපිරිසිදු දේ. 3. ඌරු මස්.

4. බූරුවාගේ සහ කොටළුවාගේ මස්.

5. දඩ නිය සහිත පාදයේ ආධාරයෙන් තම ආහාරය බුදින පක්ෂීන් සහ දඩ දත් ඇති සතුන්ගේ මාංශ.

6. නිසි ලෙස නොමැරූ මළ සතුන්ගේ මාංශ.

## 4. ඉස්ලාමිහි තහනම් කරන ලද තවත් සමහර දේ:

1. විවිධ මාදිලියේ දුරාචාරය.
2. සමලිංක සේවනය.
3. අහේතුකව අන් අය කෙරෙහි සීමාව ඉක්මවා කටයුතු කිරීම හෝ මුස්ලිම් වරයෙකුට අයුක්තියක් කිරීමට පිටිවහලක් වීම.
4. නිසි හේතුවක් නොවන්නට ඝාතනය කිරීම.
5. කාන්තාවන් ආවරණය විය යුතු දේහලක්ෂණ පිට අයට දර්ශනය කිරීම. (විශේෂයෙන්ම වත)
6. සියලු මාර්ගයේ පොලිය.
7. දෙමාපියන් හට හිංසා කිරීම.
8. අපවාද. (උදා: නිහතමානී චරිතවත් කාන්තාවකගේ ඇගේ චරිතය ඝාතනය කිරීම)
9. පිරිමින් රත්තරන් සහ පටයෙන් නිමවූ ඇඳුම් ඇඳීම.
10. ආහාරපාන සඳහා රත්තරන් සහ රිදී භාජන භාවිතය.
11. සූදුව.
12. විශ්වාසය කඩකිරීම. (වංචා කිරීම)
13. මුසාවාදය.
14. හොරකම සහ අල්ලස්.
15. නෑයන්ගෙන් (ඇත්වී) ඔවුන් හා සම්බන්ධය සිඳලීම.

(මෙම කුඩා පොත් පිංචෙ අඩංගු කර ඇත්තේ ඉස්ලාම් ආගමේ සමහර කරුණු ගැනවූ මූලික කෙටි දැනුම් දීමක විස්තරයක් පමණි. ඒවාහී එක් එක් නීතිරීති සහ කරුණු ගැන ආගමික උගතුන් ලවා තවත් සවිස්තරව පැහැදිලි කරගැනීම සහ අවබෝධ කරගැනීම පාඨක ඔබගේ පරම යුතුකමකි)

# මුස්ලිම් අත්පොත

## ප්‍රතිපත්ති-වැඳුම්පිදුම්-ගනුදෙනු

කතෘ

අබ්දුල් කරීම් අබ්දුල් මජීද් අල්-දයිවාන්

සංශෝධනය

අබූ ෂාඉරා මුහම්මදු හුසෙයින්

කැඳවීමේ හා මඟපෙන්වීමේ සහයෝගී කාර්යාලය,
අල්-රව්දා සමාජ ඒකකය-රියාද්,
සවුදි අරාබියාව. ✆ 4922422.

تم بعون الله وتوفيقه ترجمة وإصدار هذا الكتاب

**بالمكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحـي الروضـــة**

**تحت إشراف وزارة الشؤون الإسـلاميـة والأوقـاف والدعوة والإرشاد**


الرياض ١١٦٤٢ ص.ب ٨٧٢٩٩

هاتف ٤٩٢٢٤٢٢ فاكس ٤٩٧٠٥٦١



يسمح بطبع هذا الكتاب وإصداراتنا الأخرى بشرط عدم التصرف في أي شيء ما عدا الغلاف الخارجي.

**حقوق الطبع ميسره لكل مسلم**

# دليل المسلم

## عقيدة - عبادات - معاملات

# මුස්ලිම් අත්පොත

## ප්‍රතිපත්ති-වැදුම්පිදුම්-ගනුදෙනු

تأليف/عبدالكريم عبدالمجيد الديوان

ترجمة/قسم توعية الجاليات بالمكتب التعاوني

للدعوة والإرشاد بحي الروضة

(باللغة السنهالية)

කතෘ

**අබ්දුල් කරීම් අබ්දුල් මජීද් අල්-දයිවාන්**

සංශෝධනය

අබූ ෂාඉරා මුහම්මදු හුසෙයින්